සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

# Third Term Test - Grade 12 - 2018

විභාග අංකය .............................

## ආර්ථික විද්‍යාව I

කාලය පැය දෙකයි

- ❖ **සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- ❖ **නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.**

01. පහත සඳහන් ප්‍රකාශ අතුරින් සූක්ෂම ආර්ථික විද්‍යාව හා සම්බන්ධ යථානුරූපී ප්‍රකාශය තෝරන්න.
   1. සාමාන්‍ය පොලී අනුපාතිකය ඉහළ යන විට ව්‍යාපාර ආයෝජන පහළ වැටේ.
   2. සමස්ථ ඉල්ලුම වැඩිවීම හේතුවෙන් මිල මට්ටම ඉහළ යයි.
   3. සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවන විට ඒ සඳහා වන ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ.
   4. මිනිස් වුවමනා අවම කිරීම හිඟකම අවම කිරීමට හේතුවක් වේ.
   5. ආර්ථික සංවර්ධනය සඳහා සාමාන්‍ය මිල මට්ටම අවම කළ යුතුය. (..........)

02. නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධන සංකල්පයට සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. රටක ප්‍රාග්ධනය බිහිවන්නේ ආයෝජනය තුළිනි.
   2. මුදල් භාවිතයෙන් නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය මූර්ත වත්කම් අත්පත් කරගත හැකි නිසා මුදල් ප්‍රාග්ධනය ලෙස සැලකේ.
   3. වරාය, ගුවන් තොටුපොල, විදුලි බල පද්ධති, වාරි මාර්ග, ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ
   4. ශ්‍රමයේ නිපුණතාව මානව ප්‍රාග්ධනයයි.
   5. ස්වභාවික ප්‍රාග්ධනය සුලභ වීම ආර්ථික වෘද්ධියට හේතුවන සාධකයකි. (..........)

03. නිෂ්පාදන සම්පත්වල අසීමිත සැපයුමක් පවතින විටක,
   1. ආවස්ථික පිරිවැය සෘණ අගයක් ගනී.
   2. ආවස්ථික පිරිවැය ශුන්‍ය වේ.
   3. ආවස්ථික පිරිවැය ධන අගයක් ගනී.
   4. ආවස්ථික පිරිවැය අඩු වේ.
   5. ආවස්ථික පිරිවැය වැඩි වේ. (..........)

04. රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වටම විතැන්වීම සඳහා හේතු නොවන්නේ,
   1. ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන් ඇතිවන බුද්ධිගලනය.
   2. භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිත කරන තාක්ෂණයේ පහළ යෑම.
   3. යටිතල පහසුකම් හානි වීම.
   4. සම්පත් සම්භාරය හානි වීම.
   5. ප්‍රාග්ධන භාණ්ඩ වෙනුවෙන් පාරිභෝජන භාණ්ඩ ප්‍රමාණයක් කැප කිරීම. (..........)

05. X හා Y භාණ්ඩ වර්ග දෙක පමණක් නිෂ්පාදනය කරන එක්තරා ආර්ථිකයක X නිෂ්පාදනය වැඩි කරන විට Y නිෂ්පාදනයේ අඩු වීම පහත පරිදි වේ.

| X | Y |
|---|---|
| 10 | 1000 |
| 20 | 900 |
| 30 | 700 |
| 40 | 400 |
| 50 | 0 |

X නිෂ්පාදනය 30 සිට 40 දක්වා වැඩි කිරීමේදී,

| | **ආන්තික ආවස්ථික පිරිවැය** | **ආවස්ථික පිරිවැය** |
|---|---|---|
| 1. | 30 | 700 |
| 2. | 20 | 200 |
| 3. | 30 | 300 |
| 4. | 200 | 20 |
| 5. | 20 | 900 |

(..........)

06. ධනවාදී ආර්ථික පද්ධතියක් ක්‍රියාත්මකවන ආර්ථිකයක මූලික අංගයක් වනුයේ,
1. සම්පත් පිළිබඳ පොදු හිමිකාරිත්වයයි
2. ආණ්ඩුවේ මැදිහත්වීම ඉහළ මට්ටමක පැවතීමයි.
3. පුද්ගලික ව්‍යවසාය මත පදනම් වූ දේපල ක්‍රමයයි.
4. මධ්‍යගත සැලසුම් අධිකාරියක් විසින් මිල ගණන් තීරණය කිරීමයි.
5. සියලු රාජ්‍ය සේවකයන් හැර වෙනත් පුද්ගලික වෘත්තිකයන් නොමැති වීමයි. (..........)

07. ''පාරිභෝගික ස්වාධිපත්‍යය'' යන්න වෙළඳපල ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන ලක්ෂණයකි. පාරිභෝගික ස්වාධිපත්‍යය යනු,
1. ස්වාභාවික ඒකාධිකාරී තරගයත් වෙළඳපලේ පැවතීමය.
2. පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා රජය මිල පාලනයේ යෙදීමයි.
3. තම කැමැත්ත පරිදි ශ්‍රමය සංචලනය කිරීමට ශ්‍රමිකයාට නිදහස තිබීම.
4. පාරිභෝගිකයන්ට අත්‍යාවශ්‍ය භාණ්ඩ පමණක් සැපයීමට රජය මඟ පෙන්වීම.
5. පාරිභෝගිකයන් ඉල්ලුම් කරන භාණ්ඩ වෙළඳපල මගින් සැපයීම. (..........)

08. ආර්ථික පද්ධතියක කාර්යය සාධනය ඇගයීමේදී යොදා ගැනෙන නිර්නායක පහත පරිදි වේ.

A - පූර්ණ සේවා නියුක්තිය

B - රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීම.

C - සාධාරණ ආදායම් ව්‍යාප්තිය

D - රාජ්‍ය අයවැය ලේඛනය

ඉහත කරුණු අතරින් කාර්ය සාධනය ඇගයීමට වඩාත්ම ගැළපෙන පිළිතුර වන්නේ,

1. A හා C කරුණුය. 2. A හා D කරුණුය. 3. C හා B කරුණුය.
4. D හා A කරුණුය. 5. B හා D කරුණුය. (..........)

09. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

1. භාණ්ඩයක් මිලදී ගැනීම සඳහා වුවමනාවන්ට සැලසුමක් අවශ්‍ය වන නමුදු ඉල්ලුමක් සඳහා එවන් සැලසුමක් අවශ්‍ය නැති බැවිනි.
2. ඉල්ලුම අසීමිත වන අතර වුවමනාවන් ආදායමට අනුව සීමිත වන බැවිනි.
3. ඉල්ලුම සඳහා සුවිශේෂී වූ සැලසුමක් අවශ්‍ය නොවේ.
4. අසීමිත වුවමනා අතරින් සපුරාගන්නා වුවමනා ඉල්ලුම වේ.
5. ඉල්ලුම මත වුවමනා ඇති වන බැවිනි. (..........)

10. ඉල්ලුම් නීතිය මගින් ප්‍රකාශ කෙරෙනුයේ අනෙකුත් සාධක නොවනස්ව තිබියදී,

1. කජු සඳහා ඉල්ලුම වැඩිවීම හේතුකොටගෙන කජු මිල පහත වැටීමය.
2. කජු මිල ඉහළ යාම හේතුකොටගෙන කජු සඳහා ඇති ඉල්ලුම් ප්‍රමාණය පහළ යාමයි.
3. ආදායම ඉහළ යාම හේතුකොටගෙන කජු සඳහා ඇති ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යාමයි.
4. කජු මිල ඉහළ යාම හේතු කොටගෙන කජු සඳහා ඇති ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීමයි.
5. කජු සඳහා ඇති ආදේශ භාණ්ඩවල මිල පහළ යාම මත කජු සඳහා ඇති ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යාමයි.

(..........)

11. ඉල්ලුම් වක්‍රය මත ඇති සෑම ලක්ෂ්‍යකින්ම පිළිබිඹු වන්නේ,

1. අදාළ භාණ්ඩ ඒකකයක් මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයින් සතු කැමැත්ත සහ මිලදී ගැනීමේ හැකියාව මත තීරණය වන ඉහළම මිලයි.
2. නිෂ්පාදකයින් විසින් ඔවුන් නිෂ්පාදනය කරනු ලබන සියලු ඒකකයන් සඳහා පිළිගනු ලබන ඉහළම මිලයි.
3. භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා ඇති අවම පිරිවැය සහිත තාක්ෂණික ක්‍රමයකි.
4. දෙන ලද කුටුම්භයේ සියලුම වුවමනාවන්ය.
5. නිෂ්පාදකයින් හා පාරිභෝගිකයන් යන දෙපාර්ශ්වයම එකඟ වූ මිල ගණන්ය. (..........)

12. සංයුක්ත තැටියක (CD) මිල පහළ වැටීම හේතුවෙන් කැසට් පට සඳහා වූ ඉල්ලුම් වක්‍රය වමට විතැන් විය. ඒ අනුව සංයුක්ත තැටි හා කැසට් පට,

1. සාමාන්‍ය භාණ්ඩ වේ. 2. ආදේශක භාණ්ඩ වේ. 3. බාල භාණ්ඩ වේ.
4. අනුපූරක භාණ්ඩ වේ. 5. ප්‍රදර්ශනාත්මක භාණ්ඩ වේ. (..........)

13. නිෂ්පාදිතයක සැපයුමේ ඉහළ යාම මිල පහළ යාමට හේතු වුවද සත්‍ය වශයෙන් හුවමාරු වූ නිෂ්පාදිත භාණ්ඩයේ ප්‍රමාණය වෙනස් නොවීය. එසේ නම්,

1. මිල සැපයුම් නම්‍යතාවය ශුන්‍ය වේ. 2. මිල සැපයුම් නම්‍යතාවය අනන්තයකි.
3. මිල ඉල්ලුම් නම්‍යතාවය ඒකීය වේ. 4. මිල ඉල්ලුම් නම්‍යතාවය ශුන්‍ය වේ.
5. මිල සැපයුම් නම්‍යතාවය අනම්‍ය වේ. (..........)

14. භාණ්ඩ ඒකකයක මිල රු. 2.00 - රු. 1.50 දක්වා පහළ වැටෙන විට එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 1000 - 1500 දක්වා ඉහළ නැගිණි. මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය වන්නේ,

1. -2 2. -1.6 3. -2.5 4. -4.0 5. -3.5 (..........)

15. චීස් සහ බටර් යන භාණ්ඩ දෙවර්ගය නිෂ්පාදකයින් විසින් නිෂ්පාදනය කරනු ලැබේ. සම්පත් චීස් නිෂ්පාදනයෙන් බටර් නිෂ්පාදනය සඳහාත් බටර් නිෂ්පාදනයෙන් චීස් නිෂ්පාදනය සඳහාත් හුවමාරු කිරීමේදී පිරිවැයක් නොදරන බව සලකන්න.

එවන් වූ තත්ත්වයක් යටතේ බටර් මිල වැඩිවන විට චීස් සඳහා ඇති වෙළෙඳපොළ සමතුලිතයේ කිනම් වෙනසක් සිදුවෙතැයි අපේක්ෂා කළ හැකිද?

1. මිල ඉහළ ගොස් ප්‍රමාණය පහළ යනු ඇත.
2. මිල ඉහළ ගොස් ප්‍රමාණය ද ඉහළ යනු ඇත.
3. මිල පහළ ගොස් ප්‍රමාණයද පහළ යනු ඇත.
4. මිල පහළ ගොස් ප්‍රමාණය ඉහළ යනු ඇත.
5. ඉහත කිසිවක් සිදු නොවේ. (..........)

16. මෝටර් රථ සහ ඉන්ධන අනුපූරක භාණ්ඩ ලෙස සලකන්න. ඉන්ධන මිල ඉහළ යන විට මෝටර් රථ සඳහා ඇති වෙළඳපොලට පහත සඳහන් කවර අවස්ථාවක් සිදුවන්නේද?
   1. මෝටර් රථ සඳහා ඇති සමතුලිත මිල ඉහළ යනු ඇත.
   2. මොටර් රථවල සමතුලිත ප්‍රමාණය හා සමතුලිත මිල පහළ යනු ඇත.
   3. මෝටර් රථ සඳහා ඇති සැපයුම් වක්‍රය වමට විතැන් වනු ඇත.
   4. මෝටර් රථ සඳහා ඇති සැපයුම් වක්‍රය දකුණට විතැන් වනු ඇත.
   5. මෝටර් රථ සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වනු ඇත. (..........)

17. පූර්ණ නම්‍ය සැපයුමක් සහ නම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයක් මත, රු. 5.00 ක ඒකක බද්දක් පැන වූ විට, බදු බර බෙදී යන නිවැරදි ආකාරය වන්නේ,
   1. සමස්ත බදු බර පාරිභෝගිකයාට දැරීමට සිදු වේ.
   2. සමස්ත බදු බර නිෂ්පාදකයාට දැරීමට සිදු වේ.
   3. වැඩි බදු බරක් පාරිභෝගිකයාට ද අඩු බදු බරක් නිෂ්පාදකයාට ද දැරීමට සිදු වේ.
   4. වැඩි බදු බරක් නිෂ්පාදකයාට ද අඩු බදු බරක් පාරිභෝගිකයාට ද දැරීමට සිදු වේ.
   5. නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර බදු බර සමසේ බෙදී යයි. (..........)


18. එක්තරා ආර්ථිකයක ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණයන්ට අදාල වූ ලේඛනයක් පහත දැක්වේ.

| **මිල** | **ඉල්ලුම් ප්‍රමාණය** | **සැපයුම් ප්‍රමාණය** |
|---|---|---|
| 1 | 40 | 20 |
| 2 | 35 | 40 |
| 3 | 30 | 60 |
| 4 | 25 | 80 |

මෙම භාණ්ඩය මත රු. 2.00 ක සහනාධාරයක් ලබා දුන්නේ නම්, සහනාධාරයට පසු, නව සැපයුම් සමීකරණය.

1. Qs = 20 + 10 P    2. Qs = 10 P    3. Qs = 40 + 20 P
4. Qs = 60 + 20 P    5. Qs = - 20 + 10 P (..........)

19. එක්තරා භාණ්ඩ නිෂ්පාදකයෙකු මත ඒකක බද්දක් පැන වූ විට ඇති වූ ආර්ථික ප්‍රතිවිපාක පහත රූපසටහනේ දැක්වේ.





බදු පැනවීම නිසා, රජය අයහාරය, පාරිබෝගික අතිරික්තයේ වෙනස හා නිෂ්පාපාදකයාට දැරීමට සිදුවන බදු බර සම්බන්ධව නිවැරදි පිළිතුර තෝරන්න.

| | **රජයේ අයහාරය** | **පාරිභෝගික අතිරික්තයේ වෙනස** | **නිෂ්පාදකයාට දැරීමට සිදුවන බදු බර** |
|---|---|---|---|
| 1. | B + C + G + F | E + F + G | B + C |
| 2. | B + C + D + E + F + G | B + C + D | D + E |
| 3. | B + C + F + G | B + C + D | G + F |
| 4. | B + C + D + E + F + G | B + C + F + G | G + F |
| 5. | F + F + E | B + C + F + G | B + C |

(..........)

20. රජයේ මිලපාලන ප්‍රතිපත්තියක් ලෙස උපරිම මිල සීමා නියම කිරීමෙහි ආර්ථික ප්‍රතිවිපාකයක් නොවන්නේ,
   1. වෙළඳපොලෙහි භාණ්ඩ හිඟයක් ඇතිවීම.    2. කලුකඩ මිල යටතේ භාණ්ඩ අලෙවි කිරීම
   3. නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන සීමාවීම.    4. වෙළඳපල තුළ පෝලිම් ක්‍රමයක් දක්නට ලැබීම.
   5. භාණ්ඩ වෙළඳපල තුළ තොග සමුච්ඡනයක් දක්නට ලැබීම. (..........)


21. එක්තරා භාණ්ඩයක් මත රජය විසින් අවම මිලක් නියම කිරීම හේතුවෙන් ඇතිවන්නා වූ අතිරික්තය මිලදී ගැනිමට රජය ඉදිරිපත් වන්නේ නම්, සමාජයට අහිමිවන ශුද්ධ ශුභ සාධනය වනුයේ,




1. රු. 4500.00
2. රු. 1500.00
3. රු. 6000.00
4. රු. 500.00
5. රු. 4000.00 (..........)

22. නිෂ්පාදකයන්ගේ ආදායම් ස්ථායිකිරීම සඳහා රජය විසින් ගනු ලබන මිල ස්ථායිකරණ වැඩපිළිවෙලට අයත් නොවන ක්‍රියාමාර්ගය වන්නේ,
1. නිෂ්පාදකයන් මත සලාක නියම කිරීම.
2. ආනයන තීරු බදු ඉවත් කිරීම
3. තොග රැස්කිරීම හා බෙදා හැරීම.
4. වගා කරන ඉඩම් ප්‍රමාණය සීමා කිරීම
5. අහිමත පරිදි සිදු කරන ආනයන සීමා කිරීම. (..........)

23. පූර්ණ තරගකාරී වෙළඳපලක එක්තරා භාණ්ඩ නිෂ්පාදකයෙකු වෙත රු. 15.00 ක ඒකක සහනාධාරයක් ලබා දුන් පසු භාණ්ඩයට අදාල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත පරිදි වේ.




සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තය වනුයේ,

1. රු. 5250.00
2. රු. 8000.00
3. රු. 8125.00
4. රු. 4375.00
5. රු. 6000.00 (..........)

24. මිල ආධාරක ප්‍රතිපත්තියක් ලෙස ඌණ පූර්ණ ගෙවීම් ක්‍රමයට අදාළ නිවැරදි වරණය වනුයේ,
1. සමාජ ශුභසාධනයට අදාළ බලපෑම ධන අගයක් ගැනීම.
2. නිෂ්පාදන අතිරික්තය වැඩි වුවද පාරිභෝගික අතිරික්තය අඩුවීම.
3. පාරිභෝගික අතිරික්තය වැඩි වුවද නිෂ්පාදන අතිරික්තය අඩුවීම.
4. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය වැඩිවීම.
5. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය අඩුවීම. (..........)

25. නිෂ්පාදන ක්‍රියාවලියේ කෙටිකාලයේදී,
1. පරිමාණානුකූල ඵල ක්‍රියාත්මක වේ.
2. සියලුම යෙදවුම් වැඩි කරමින් නිමැවුම වැඩිකළ හැකිය.
3. නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගන්නා ඇතැම් යෙදවුම් නොවෙනස්ව පවතී.
4. නිෂ්පාදන ප්‍රමාණය නොවෙනස්ව පවතී.
5. සාමාන්‍ය ස්ථාවර පිරිවැය ස්ථාවරව පවතී. (..........)

26. පහත සඳහන් වියදම් වර්ග අතරින් ස්ථාවර වියදම් ලෙස සැලකිය හැක්කේ,
1. ඉන්ධන හා විදුලිය සඳහා දරන ලද වියදම්
2. අමුද්‍රව්‍ය ලිපි ද්‍රව්‍ය සඳහා දරන ලද වියදම්
3. ශ්‍රමිකයින්ට වැටුප් ගෙවීම සඳහා දරන ලද වියදම
4. ප්‍රවාහන වියදම් හා දුරකථන ගාස්තු සඳහා දරන ලද වියදම්
5. රක්ෂණ වාරික හා බලපත්‍ර ගාස්තු සඳහා දරන ලද වියදම් (..........)

27. හීනවන ආන්තික ඵල හටගනු ලබන්නේ,

1. සාමාන්‍ය විචල්‍ය පිරිවැය පහළ බසින විටය.
2. මුළු නිෂ්පාදිතය අඩුවන වේගයෙන් ඉහළ නගින විටය.
3. ආන්තික නිෂ්පාදිතය අඩුවන වේගයෙන් ඉහළ නගින විටය
4. මුළු නිෂ්පාදිතය පහළ බසින විටය.
5. සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය පහළ බසින විටය. (..........)

28. නිෂ්පාදන ආයතනයක පළමු ඒකකය නිෂ්පාදනය කිරීම සඳහා යන මුළු වියදම රු. 240 ක් වන අතර, එවිට ආන්තික පිරිවැය රු. 40 ක් වේ. නිමැවුම ඒකක 2 දක්වා වැඩි කරන විට ආන්තික පිරිවැය රු. 30 ක් වේ. මෙම තොරතුරු වලට අනුව, ඒකක 2 ක් නිෂ්පාදනය කරන විට, ආයතනයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය කොපමණද?

| | සාමාන්‍ය ස්ථාවර පිරිවැය (රු.) | සාමාන්‍ය විචල්‍ය පිරිවැය (රු.) |
|---|---|---|
| 1. | 100 | 35 |
| 2. | 240 | 40 |
| 3. | 100 | 30 |
| 4. | 270 | 70 |
| 5. | 100 | 20 |

(..........)

29. අඩුවන පරිමාණානුකූල ඵල ලබන නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේද?

1. සියලු යෙදවුම් වෙනස් කරන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් නිමැවුම වෙනස් වේ.
2. ආයතනයේ දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළ බසියි.
3. සියලු යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් නිමැවුම වර්ධනය වේ.
4. යෙදවුම් 20% ක් වැඩිකරන විට නිමැවුම 15% න් වැඩි වේ.
5. ආයතනය මහා පරිමාණ පිරිමැසුම් අත්කර ගනියි. (..........)

30. පූර්ණ තරගකාරී ආයතනයක භාණ්ඩයේ මිල සෑම විටම,

1. සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ.
2. ආන්තික පිරිවැයට සමාන වේ.
3. ආනතික අයභාරයට සමාන වේ.
4. මුළු අයභාරයට සමාන වේ.
5. මුළු විචල්‍ය පිරිවැයට සමාන වේ. (..........)

31. පූර්ණ තරඟකාරී කර්මාන්තයක කටයුතු කරන ආයතනයක කෙටිකාලයට අදාළ නිෂ්පාදනය පිළිබඳ පහත තොරතුරු සපයා ඇත.

| | | |
|---|---|---|
| වර්තමාන නිමැවුම් මට්ටම | = | ඒකක 500 |
| මුළු පිරිවැය | = | රුපියල් 5000 |
| මුළු ස්ථාවර පිරිවැය | = | රුපියල් 1000 |
| ආන්තික පිරිවැය | = | රුපියල් 10 |

මෙම ආයතනය ප්‍රමාණික ලාභ උපයයි නම්, ඒකකයක පෙළෙඳපොල මිල කොපමණද?

1. රුපියල් 8 කි
2. රුපියල් 10 කි.
3. රුපියල් 12 කි.
4. රුපියල් 9 කි.
5. රුපියල් 6 කි. (..........)

32. නිෂ්පාදන සාධකයක මුළු ඉපයීම සංක්‍රාම ඉපයුම් වලින් පමණක් සමන්විත වේ නම් එම නිෂ්පාදන සාධකයේ සැපයුමේ නම්‍යතාව,

1. පූර්ණ අනම්‍ය වේ.
2. නම්‍ය වේ.
3. අනම්‍ය වේ.
4. පූර්ණ නම්‍ය වේ.
5. ඒකීය නම්‍ය වේ. (..........)

33. රටක සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වයට දායක වන ආර්ථික කාරක සඳහා ඇතුළත් නොවන ආර්ථික කාරකය හඳුනා ගන්න.
1. කුටුම්භ අංශය  2. රාජ්‍ය නොවන අංශය  3. ව්‍යාපාරික අංශය
4. රාජ්‍ය අංශය  5. විදේශ අංශය  (..........)

34. සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වයට බලපෑම් කරන මූලික විචල්‍යයන් සඳහා ඇතුළත් නොකරන විචල්‍ය වන්නේ,
1. සේවා නියුක්තිය  2. විනිමය අනුපාතය  3. පොලී අනුපාතය
4. තිරසාර සංවර්ධනය  5. ගෙවුම් ශේෂය  (..........)

35. ව්‍යාපාර චක්‍රය මගින් පෙන්නුම් කරන්නේ,
1. විභව නිමවුමේ සිදුවන උච්චාවචනයයි.  2. ප්‍රශස්ත නිමවුමේ සිදුවන උච්චාවචනයයි.
3. ආර්ථික වර්ධනයේ සිදුවන උච්චාවචනයයි.  4. ප්‍රසාරණ අවධියක සිදුවන උච්චාවචනයයි.
5. සාර්ව ආර්ථිකයක සිදුවන උච්චාවචනයයි.  (..........)

36. ජාතික ගිණුම් කරණයේදී නිෂ්පාදන ඉමට ඇතුළත්කරගන්නා නිෂ්පාදන ක්‍රියාකාරකම වන්නේ,
1. කිරි මුදවා ගැනීම.  2. නිවසේ සාමාජිකයන්ට ආහාර පිසීම
3. දරුවන් රැක බලාගැනීම.  4. නිවසේ ආබාධිතයන් රැක බලාගැනීම.
5. නිවසේ අලංකරණයට මල් වගා කිරීම  (..........)

37. ජාතික ගිණුම් වලදී බැහැර කරන ඵලදායී නොවන ගණුදෙනුව වන්නේ,
1. නොගෙවූ ගෘහ සේවය  2. ස්වාභාවික වනාන්තර වර්ධනය
3. මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු  4. ඉගෙනීම සහ විවේකය
5. ස්වාභාවික වර්ධන මගින් සම්පත්වල වටිනාකමේ වෙනස්වීම  (..........)

38. ආදායම් ප්‍රවේශයේදී දළ මෙහෙයුම් අතිරික්තය ලෙස සැලකෙන්නේ,
1. වැටුප් හා වේතන සහ සමාගමික ලාභයයි.  2. පොලී, බදු කුලී සහ දළ ලාභයයි.
3. පොලී ශුදධ බදු සහ සාමගමික ලාභයයි.  4. මිශ්‍ර ආදායම් සහ සේවක ආදායමයි
5. සේවක ආදායම් සහ ස්වයං සේවා නියුක්ති ආදායමයි.  (..........)

39. වියදම් ප්‍රවේශය යටතේ පෞද්ගලික පරිභෝජන වියදම + රාජ්‍ය පරිභෝජනය + දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය එකතුකළ විට ලැබෙන ගිණුම්කරණ සංකල්පය වන්නේ,
1. වෙළඳපොල මිලට දළ ජාතික වියදම  2. වෙළඳපොළ මිලට දළ දේශීය වියදම
3. වෙළඳ මිලට දළ දේශිය නිෂ්පාදිතය  4. වෙළඳ මිලට දළ ජාතික ආදායම
5. වෙළෙඳපොල මිලට වැයකළ හැකි දළ දේශීය නිෂ්පාදිතය  (..........)

40. නිෂ්පාදකයාගේ මිල ගණනය කරන නිවැරදි ආකාරය ලෙස ඔබ සලකන්නේ පහත ක්‍රම අතුරින් කවරක්ද?
1. මූලික මිල - නිෂ්පාදිත මත සහනාධාර  2. වෙළඳමිලට නිෂ්පාදිතය + නිෂ්පාදන බදු
3. මූලික මිල - නිෂ්පාදනය මත වෙනත් බදු  4. මූලික මිල+ නිෂ්පාදිතය මත බදු - නිෂ්පාදිත මත සහනාධාර
5. නිෂ්පාදකයාගේ මිල - නිෂ්පාදිත මත ශුද්ධ බදු  (..........)

41. ජාතික ගිණුම් වලදී සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + නිෂ්පාදනය මත වෙනත් බදු අඩුකලා, සහනාධාර සමාන වන්නේ,
1. වෙළඳ මිලට දළ ජාතික ආදායම  2. වෙළඳ මිල අනුව ද.දේ. නිෂ්පාදිතය
3. වෙළඳ මිලට සමස්ත එකතුකළ අගය  4. නිෂ්පාදකයින්ගේ මිලට සමස්ත එකතුකළ අගය
5. මූලික මිලට සමස්ත එකතුකළ අගය  (..........)

42. වෙළඳ මිලට අනුව දළ ජාතික ආදායම ගණනය කළ හැකි නිවැරදි ක්‍රමය හඳුනාගන්න.
1. දළ දේශීය වියදම + අපනයන - ආනයන
2. දළ දේශීය වියදම + ආනයන - අපනයන
3. වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය + ද්විතීක ආදායම් ශේෂය (විදේශ)
4. වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය + විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම
5. වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම + විදේශ ශුද්ධ සංක්‍රාම  (..........)

43. සාර්ව ආර්ථික සමතුලිතයේදී සමාහාර ඉල්ලුම සමන්විත වන්නේ කුමන සංරචක වලින්ද?
1. පෞද්ගලික පරිභෝජනය, ආයෝජනය, අපනයන, ක්ෂයවීම් මගිනි
2. පෞද්ගලික පරිභෝජනය, ආයෝජනය, ශුද්ධ අපනයන, රජයේ වියදම් මගිනි
3. පෞද්ගලික පරිභෝජනය, රජයේ පරිභෝජනය, ශුද්ධ වක්‍ර බදු, ආනයන මගිනි.
4. පෞද්ගලික රජයේ පරිභෝජනය, ආයෝජනය, ශුද්ධ බදු මගිනි
5. පෞද්ගලික පරිභෝජනය, ශුද්ධ අපනයන, රාජ්‍ය වියදම්, ඉතුරුම් මගිනි (..........)

44. ස්වාධීන පරිභෝජන වියදම රු. 50 ක් හා සෑම වැයකළ හැකි ආදායමේ රුපියලකින්ම ශත 75 ක් පරිභෝජනය කරයි නම්, පරිභෝජන ශ්‍රිතය කෙසේ සකස් වේද?
1. C = 50 + 0.75 Yd 2. C = 75 + 0.50 Yd 3. C = 50 - 0.75 Yd
4. C = 50 + 75 Yd 5. C = 75 + 50 Yd (..........)


45. ඉතුරුම් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. වැයකළ හැකි ආදායමෙන් පරිභෝජනය නොකරන කොටස කුටුම්බ ඉතුරුම් වේ.
2. ඉතුරුම් රඳා පවතින්නේ වැය කළ හැකි ආදායම මතය.
3. නිර් ඉතුරුම් යනු ශූන්‍ය ආදායම් මට්ටමේදී හටගන්නා පරිභෝජන වියදමයි.
4. පරිභෝජන වියදම් වැය කළහැකි ආදායමට වඩා වැඩි වන විට පවතින්නේ ඉතුරුම් ය.
5 පරිභෝජන වියදම් වැය කළ හැකි ආදායමට සමාන වන විට ඉතුරුම් ශූන්‍ය වේ. (..........)

46. එක්තරා කල්පිත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 80 + 0.7 Y හා සමතුලිත ආදායම් මට්ටම රු.මි. 1500 ක් විය. (Y = 1500) ඉතුරුම් කොපමණ වේද?
1. 270 2. 450 3. 80 4. 530 5. 370 (..........)

47. ආයෝජන වියදම ආදායම මත තීරණය නොවන ස්වායත්ත වියදමක් ලෙස උපකල්පනය කළහොත් ආයෝජන වියදම් රේඛාව,
1. සිරස් අක්ෂයට සමාන්තරව සරල රේඛාවක් ලෙස පිහිටයි.
2. තිරස් අක්ෂයට සමාන්තරව සරල රේඛාවක් ලෙස පිහිටයි.
3. වමේ සිට දකුණට බෑවුම් වන සරල රේඛාවක් ලෙස පිහිටයි.
4. ධන බෑවුමක් සහිතව පහළට බෑවුම්වන සරල රේඛාවක් ලෙස පිහිටයි.
5. ඍණ බෑවුමක් සහිතව ඉහළ නගින සරල රේඛාවක් ලෙස පිහිටයි. (..........)

48. කල්පිත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 300 + 0.75 Yd බවත් ආායෝජනය I = 500 බවත් උපකල්පනය කරන්න. රජයේ වියදම් හා ශුද්ධ අපනයන නැතැයි උපකල්පනය කළ විට මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම,
1. 320 2. 800 3. 1320 4. 3200 5. 8000 (..........)

49. සරල ආර්ථිකයක ආදායම් මට්ටම රු.බි. 4000 සිට 4500 දක්වා වැඩිවන විට සමාහාර පරිභෝජන වියදම රු.බි. 2000 සිට 2300 දක්වා වැඩිවිය. මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැඹියාව හා රු. 4000 දී සාමාන්‍ය පරිභොජන නැඹියාව පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. 1.6, 2 2. 0.6, 2 3. 0.6, 1.6 4. 0.6, 0.5 5. 1.6 , 0.5 (..........)

50. 


මෙම ප්‍රස්තාර සටහනේ පරිභෝජන ශ්‍රිතය හා සමතුලිත ජාතික ආදායම රේඛාවට අනුව A පරාසයේදී දැක්වෙන්නේ,
1. ජාතික ආදායම සංකෝචනයක් වන බවයි.
2. ජාතික ආදායම සමතුලිතයක් පවතින බවයි.
3. ඉතුරුම් ධන අගයක් ගන්නා බවයි.
4. ඉතුරුම් ඍණ අගයක් ගන්නා බවයි.
5. පරිභෝජන වැඩි වී ඇති බවයි. (..........)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

ආර්ථික විද්‍යාව II

කාලය පැය තුනයි

❖ **''අ '' කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද ''ආ'' උප කොටසෙන් අවම වශයනේ ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## අ උප කොටස

01). i. ''ආර්ථික සම්පත් , අර්ථික භාණ්ඩ ලෙසද හැඳින්විය හැක'' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ආර්ථික පද්ධති වර්ග කිරිම සඳහා භාවිත කරන නිර්ණායක හඳුන්වා ඒ අනුව ආර්ථික පද්ධති වර්ගීකරණ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. වර්තමාන පරිභෝජනය හා අනාගත පරිභෝජනය අතර සම්පත් වෙන්කරන ආකාරය, රටක ආර්ථික වෘද්ධිය තීරණය කරන වැදගත් සාධකයක් බව අදාළ රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. පහත දී ඇති ආර්ථික සංසිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(අ) සාධක ඵලදායිතාවයේ අඩු වීමක්

(ආ) වැඩි වන ආවස්ථික පිරිවැය

(ඉ) X භාණ්ඩ නිෂ්පාදනය සඳහා වූ අමුද්‍රව්‍ය තොගයක් විනාශ වීම

(ඊ) විදේශ ණය ආයෝජන ඉහළ යාමක් (ලකුණු 2 x 4 = 8)

02). i. සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ව්‍යාවසායකයාගෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. ආර්ථික වශයෙන් කාර්යක්ෂමතාව අත්කරගත් ආර්ථිකයක දක්නට ලැබෙන ලක්ෂණ කවරේද? (ලකුණු 4)

iv. හිඟකම පිළිබඳ ගැටලුවට මුහුණ දෙමින් ආර්ථිකය මෙහෙය වීමේදී වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් හා විධානගත ආර්ථික පද්ධතියක් එකිනෙකින් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.(ලකුණු 4)

v. සමාජවාදී වෙළෙඳපොළ ආර්ථිකයක් හා සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් අතර පවතින වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 4)

03). i. (අ) ඉල්ලුම යන්න නිර්වචනය කර පෞද්ගලික ඉල්ලුම වෙළඳපොළ ඉල්ලුමෙන් වෙනස් වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)

(ආ) වෙළඳපොළේ X භාණ්ඩය සඳහා A,B,C යනුවෙන් පාරිභෝගිකයින් තිදෙනෙක් පමණක් ඇතැයි උපකල්පනය කරන්න. ඒ අනුව X භාණ්ඩය සඳහා ඇති පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිත පහත දැක්වේ.

$$Qd_A = 600 - 5Px \qquad Qd_B = 1000 - 10Px \qquad Qd_C = 1600 - 15Px$$

X භාණ්ඩය සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම් ශ්‍රිතය ගොඩනගන්න. (ලකුණු 2)

ii. (අ) දෙසැම්බර් මාසයේදී නත්තල් ගස්වල මිල ඉහළ ගිය අතර, විකුණන ලද නත්තල් ගස් ප්‍රමාණය ද ඉහළ ගියේය. මෙය ඉල්ලුම් නීතියට පටහැනි වූ අවස්ථාවක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන අවස්ථාවකදී ආදායම් ස්ථාවර යැයි උපකල්පනය කෙරේ. නමුත් ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීමකට බලපාන එක් කරුණක් නම් ආදායම් ප්‍රතිවිපාකයයි. පැහැදිලි කරන්න. (ලකුණු 3)

iii. (අ) ගව පාලනය සිදුකරන රටවල නියගය හේතුවෙන් ගවමස් සපයන්නන් විශාල වශයෙන් පහළ වැටිනි. පාරිභෝගිකයෝ ආදේශකයක් ලෙස කුකුළු මස් පරිභෝජනයට යොමු වූහ. මෙම තත්ත්වය ගවමස් වෙළඳපොළ සැපයුම් හා ඉල්ලුම් වක්‍ර ඇසුරින් දක්වන්නේ කෙසේද? (ලකුණු 2)

(ආ) i. පහත දක්වා ඇති ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඇසුරින් අධි ඉල්ලුම් හා අධි සැපයුම් සමීකරණය ගොඩ නගන්න.

$Qd = 24 - 4P$ $Qs = +4P$ (ලකුණු 2)

ii. ඉහත අධි ඉල්ලුම් සමීකරණය හා අධි සැපයුම් සමීකරණය භාවිතයෙන් අධි ඉල්ලුම් මිල සහ අධි ඉල්ලුම් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

iv. වෙළඳපොළේ ක්‍රිකට් පන්දු සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$Qd = 70 - 2P$ $Qs = -14 + 5P$

(අ) ක්‍රිකට් පන්දු සඳහා ඇති වෙළඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) වෙළඳපොළ සමතුලිත අගයන්හි දී මිල ඉල්ලුම් සහ මිල සැපයුම් නම්‍යතා අගයන් ගණනය කරන්න. (ලකුණු 2)

04). එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් වූ වෙළඳපල ඉල්ලුම් හා සැපයුම් ලේඛනය පහත පරිදි වේ.

| **මිල** | **ඉල්ලුම් ප්‍රමාණය** | **සැපයුම් ප්‍රමාණය** |
|---|---|---|
| 2 | 50 | 10 |
| 4 | 40 | 20 |
| 6 | 30 | 30 |
| 8 | 20 | 40 |

i. ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ආශ්‍රයෙන් වෙළෙඳපල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 4)

ii. මෙම භාණ්ඩය මත රජය විසින් රු. 4.00 ක උපරිම මිලක් නියම කළහොත් වෙළඳපොල තුළ ඇතිවන

(අ) අධි ඉල්ලුම ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) උපරිම කළු කඩ මිල ගණනය කරන්න (ලකුණු 2)

(ඇ) අහිමිවන සමාජ ශුභ සාධනය ගණනය කරන්න. (ලකුණු 2)

(ඉ) උපරිම මිලට පෙර හා පසු ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)

iii. උපරිම මිල නියම කිරිම වෙනුවට, මෙම වෙළඳපොල වෙත රු. 10 ක අවම මිලක් නියම කිරීම සඳහා රජය තීරණය කළේ යැයි සිතන්න.

(අ) අවම මිල සීමා නියම කිරීමෙහි ආර්ථික ප්‍රතිවිපාක දක්වන්න. (ලකුණු 4)

(ආ) අවම මිල අර්ථවත් කිරීම සඳහා රජය අනුගමනය කරන ඌණ පූර්ණ ගෙවීමේ ප්‍රතිපත්තිය අනුව රජයට දැරීමට සිදුවන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 4)

05). එක්තරා වෙළඳපලක සමතුලිත මිල රු. 5.00 ලෙසද සමතුලිත ප්‍රමාණය 100 ක් ලෙස ද පාරිභෝගික අතිරික්තය රු. 1000.00 ලෙස ද නිෂ්පාදන අතිරික්තය රු. 200.00 ක් ලෙස ද උපකල්පනය කරන්න.

i. මෙම වෙළඳපලට අදාළ උපරිම ඉල්ලුම් මිල හා අවම සැපයුම් මිල ගණනය කරන්න. (ලකුණු 4)

ii. මෙම වෙළඳපලට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩනගන්න. (ලකුණු 4)

iii. මෙම වෙළඳපල මත රු. 6.00 ක ඒකක බද්දක් පැනවීමට රජය තීරණය කළේ නම්,

(අ) නව සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) බද්දෙන් පසු පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)

(ඉ) අධි බදු බර කොපමණද? (ලකුණු 2)

iv. මෙම නිෂ්පාදිතය සඳහා පනවා තිබූ ඒකක බද්ද ඉවත්කොට රු. 3 ක ඒකක සහනාධාරයක් ලබා දීමට රජය කටයුතු කරන්නේ නම්, සහනාධාරයෙන් පසු,

(අ) පාරිභෝගික අතිරික්තයේ ඇතිවන වෙනස ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) සහනාධාරය සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? (ලකුණු 2)

(ඉ) අහිමිවන සමාජ ශුභ සාධනය ගණනය කරන්න. (ලකුණු 2)

## ආ කොටස

06). i. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය හඳුන්වන්න. (ලකුණු 4)

ii. පහත සඳහන් පිරිවැය ස්ථාවර පිරිවැයට අයත් වේද? විචල්‍ය පිරිවැයට ඇතුළත් වේද?

අ) ප්‍රමාණික ලාභ ආ) ශ්‍රමිකයින්ට වැටුප් ගෙවීම්

ඇ) ප්‍රධාන විධායක නිලධාරී වැටුප ඉ) ප්‍රවාහන වියදම් හා විදුලිබල ගාස්තු (ල. 1 බැගින් ල. 4)

iii. නිෂ්පාදන ආයතනයක් දිගුකාලයේදී ලබන ඵලදාව එම ආයතනයේ සාමාන්‍ය පිරිවැය වක්‍රය සමග සම්බන්ධ වන්නේ කෙසේද? රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. ''පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙයි'' මෙයින් අදහස් කරන්නේ කුමක්ද? මේ සඳහා බලපාන හේතු කවරේද? (ලකුණු 4)


v. කෙටි කාලයෙහි නිෂ්පාදනයේ නිරතව සිටින ආයතනයක් ඒකකයක් මිල රු. 10 ක මිලට ඒකක 100 ක් අලෙවි කරයි. මෙම ආයතනයේ මුළු පිරිවැය රු. 1200 ක් වන අතර, මුළු ස්ථාවර පිරිවැය රු. 400 කි. මෙවැනි තත්ත්වයක් යටතේ මෙම ආයතනය නිෂ්පාදනයේ රැඳී සිටිය යුතු ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 4)

07). i. නිෂ්පාදන සාධක වෙළඳපොළ හා භාණ්ඩ වෙළෙඳපොල අතර දක්නට ලැබෙන වෙනස්කම් කවරේද? (ලකුණු 4)

ii. ''ප්‍රමාණික ලාභ, සංක්‍රාම ඉපයීමක් වේ'' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. ඒකකාධිකාරී වෙළඳපොළ හා කතිපයාධිකාරී වෙළඳපොළ අතර දක්නට ලැබෙන සමානකම් හා අසමානකම් 2 බැගින් සඳහන් කරන්න. (ලකුණු 4)

iv. පූර්ණ තරගකාරී වෙළඳපොළක් තුළ කටයුතු කර නිෂ්පාදන ආයතනයක කෙටිකාලීන හැසිරීම පහත රූප සටහන පෙන්නුම් කරයි.




(අ) ඒකකයක වෙළඳපොල මිල රු. 30 ක් වේ නම් ලාභ උපරිම කෙරෙන නිමවුම් මට්ටම කොපමණද? (ලකුණු 2)

(ආ) එම මිලේදී ආයතනය ඒකකයකට ලබන ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 2)

(ඉ) මෙම ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණද? (ලකුණු 2)

(ඊ) ආයතනය නිෂ්පාදනය අත්හිටුවීමට තීරණය කරන මිල කොපමණද? (ලකුණු 2)

08). i. ආර්ථික පසු බැසීම යනුවෙන් කුමක් අදහස්වේද? (ලකුණු 2)

ii. ආර්ථිකයක විභව නිමැවුම යන්න නිර්වචනය කරන්න. (ලකුණු 2)

iii. රටක ආර්ථික කාරක නම් කරන්න. (ලකුණු 4)

iv. ජාතික ගිණුම්කරණයේදී නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු ස්වරූප දෙක පැහැදිලි කරන්න. (ලකුණු. 4)

v. (අ) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන ඵලදායී කටයුතු මොනවාද? (ලකුණු 5)

(ආ) දේශීය නිමැවුම ගණනය කිරීමේදී බැහැර කෙරෙන ඵලදායී නොවන ගණුදෙනු මොනවාද?(ල. 3)

09). i. සමස්ත ආර්ථික ප්‍රදේශයක් තුළ සිටින ප්‍රධාන ආයතනික ඒකක මොනවාද? (ලකුණු 3)

ii. නව ජාතික ගිණුම්කරණ ප්‍රවේශයට අනුව ශ්‍රී ලංකාවේ දළදේශීය ආදායම් සංරචක නම් කරන්න. (ලකුණු. 3)

iii. ජාතික ගිණුම් පිළියෙළ කිරීමේදී පවතින සීමා ලෙස ඔබ සලකනු ලබන්නේ කුමන ආකාරයේ සීමාවන්ද? (ලකුණු 4)

v. පහත දැක්වෙන්නේ ජාතික ගිණුම් පිළිබඳ දත්ත සමහරකි.

| | |
|---|---|
| - කුටුම්බ පරිභෝජනය | 750 |
| - දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධනය | 800 |
| - වටිනාකමේ වෙනස්වීම් | 300 |
| - තොග වෙනස්වීම් | 500 |
| - ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්භ වෙත සපයන සේවා | 200 |
| - රජයේ පරිභෝජනය | 50 |
| - අපනයන | 1000 |
| - ආනයන | 600 |
| - විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම් | 1600 |
| - විදේශ ශුද්ධ ජංගම සංක්‍රාම / ද්විතියික ආදායම් ගිණුම (ශුද්ධ විදේශීය) | 500 |
| - විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම් | 1800 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) අවසාන පරිභොජන වියදම
(ආ) වෙළඳ මිලට දළ දේශීය වියදම
(ඇ) වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය
(ඈ) වෙළඳ මිලට දළ ජාතික ආදායම
(ඉ)වෙළඳ මිලට වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 2 බැගින් ලකුණු 10)

10). i. සාර්ව ආර්ථික සමතුලිතය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 3)

ii. සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි විවිධ ප්‍රවේශ නම් කරන්න. (ලකුණු 3)

iii. $C = 100 + 0.75\,Y$ යන පරිභෝජන ශ්‍රිතය ඔබට දී ඇතැයි සිතන්න

(අ) එම පරිභෝජන ශ්‍රිතයට අදාළ ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 2)

(ආ) ඉතුරුම් ශුන්‍ය වන අවස්ථාවේ ආදායම කොපමණද? (ලකුණු 2)

(ඇ) එම ආදායම් මට්ටමේදී මුළු පරිභෝජනය සොයන්න. (ලකුණු 2)

iv. ආන්තික පරිභෝජන නැඹියාව හා සාමාන්‍ය පරිභෝජන නැඹියාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. පහත දැක්වෙන ආර්ථික තොරතුරු ඇසුරෙන් සාර්ව ආර්ථික සමතුලිතය ආදායම් වියදම් ප්‍රවේශය මගින් ගණනය කරන්න. (ලකුණු 4)

| | |
|---|---|
| පරිභෝජන ශ්‍රිතය | $C = 400 + 0.8\,Yd$ |
| ආයෝජන වියදම් | $I = 100$ |
| රාජ්‍ය වියදම් | $G = 200$ |
| ශුද්ධ අපනයන | $X - M = -100$ |
| ස්වාධීන බදු | $T = 150$ |

**2018 තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය**

# ආර්ථික විද්‍යාව

**<u>පිළිතුරු පත්‍රය</u>**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1) 3 | 11) 1 | 21) 1 | 31) 2 | 41) 5 |
| 2) 2 | 12) 2 | 22) 2 | 32) 4 | 42) 4 |
| 3) 2 | 13) 4 | 23) 2 | 33) 2 | 43) 2 |
| 4) 5 | 14) 1 | 24) 4 | 34) 4 | 44) 1 |
| 5) 3 | 15) 1 | 25) 3 | 35) 5 | 45) 4 |
| 6) 3 | 16) 2 | 26) 5 | 36) 1 | 46) 5 |
| 7) 5 | 17) 1 | 27) 2 | 37) 3 | 47) 2 |
| 8) 1 | 18) 3 | 28) 1 | 38) 2 | 48) 4 |
| 9) 4 | 19 3 | 29) 4 | 39) 2 | 49) 4 |
| 10) 2 | 20 5 | 30) 3 | 40) 4 | 50) 4 |

## II කොටස

### <u>අ කොටස</u>

---

**01). i.** ''ආර්ථික සම්පත් , අර්ථික භාණ්ඩ ලෙසද හැඳින්විය හැක'' මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? හේතු පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

**ii.** ආර්ථික පද්ධති වර්ග කිරීම සඳහා භාවිත කරන නිර්ණායක හඳුන්වා ඒ අනුව ආර්ථික පද්ධති වර්ගීකරණ වන ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

**iii.** වර්තමාන පරිභෝජනය හා ආනයන පරිභෝජනය අතර සම්පත් වෙන්කරන ආකාරය, රටක ආර්ථික වෘද්ධිය තීරණය කරන වැදගත් සාධකයක් බව අදාල රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

**iv.** පහත දී ඇති ආර්ථික සංසිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**(අ)** සාධක ඵලදායිතාවයේ අඩු වීමක් **(ආ)** වැඩි වන ආවස්ථික පිරිවැය

**(ඉ)** **X** භාණ්ඩ නිෂ්පාදනය සඳහා වූ අමුද්‍රව්‍ය තොගයක් විනාශ වීම

**(ඊ)** විදේශ ණය ආධාරවල ඉහළ යාමක් **(ලකුණු 2 x 4 = 8)**

01). i. ඒකඟ නොවේ

- ආර්ථික සම්පත් යනු නිෂ්පාදන සාධක අතරින් සීමිත සැපයුමක් ඇති හිඟ සම්පත් ය.
  හිඟකම ආර්ථික සම්පත්වල මූලික ලක්‍ෂණය වන බැවින් ආර්ථික සම්පත් උපයෝජනය කිරීමේදී ආවස්ථික පිරිවැයක් හට ගනී. (ල. 1)
  උදා - හිරු එළිය, වාතය හැරුණු විට අනෙකුත් නිෂ්පාදන සාධක ආර්ථික සම්පත් වේ. (ල. 1)
- නමුත් සැපයුමේ හිඟයක් දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ.
  නිෂ්පාදනයේ දී ආර්ථික සම්පත් උපයෝජනය කරමින් ආවස්ථික පිරිවැයක් හටගන්නා නිෂ්පාදන ක්‍රියාවලියක් හා මිලක් නියම වූ භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ. (ල. 1)
  උදා - මෝටර් රථ, ඇඳුම්,පොත්, ගෘහ භාණ්ඩ
  මේ අනුව ආර්ථික සම්පත් යනු ආර්ථික භාණ්ඩ නොවේ. (ල. 1)

ii. නිර්ණායක - තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය - සම්පත් හිමිකාරිත්වයේ ස්වරූපය
- සානුබල ස්වභාවය (ල. 1)

තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණයේ ස්වරූපය යන නිර්ණායකය මත ආර්ථික පද්ධති පහත පරිදි වර්ග කළ හැක (ල. 1)

- වෙළඳපල ආර්ථික පද්ධති - විධානගත ආර්ථික පද්ධති (සැලසුම්ගත)

නිෂ්පාදන සම්පත්වල හිමිකාරිත්වය හා දේපල අයිතිවාසිකම්වල ස්වභාවය මත ආර්ථික පද්ධති පහත පරිදි වර්ග කළ හැක.


- ධනේශ්වර ආර්ථික පද්ධති - සමාජවාදී ආර්ථික පද්ධති (ල. 1)


නිර්ණයක සියල්ල පදනම් කරගෙන ද ආර්ථික පද්ධති වර්ග කිරීම පහත පරිදි සිදු කළ හැක.

- වෙළඳපල ආර්ථික පද්ධති - විධානගත ආර්ථික පද්ධති - මිශ්‍ර ආර්ථික පද්ධති (ල. 1)

iii. වර්තමානයේ ආර්ථිකය තම හිඟ සම්පත් භාවිත කරන ආකාරය මත එම ආර්ථිකයට උරුමවන අනාගත සම්පත් සම්භාරය තීරණය වනු ඇත.
වර්තමානයේදී ඉහළ සම්පත් ප්‍රමාණයක් පරිභෝජනය සඳහා කැපකළහොත් අනාගතයේදී ආර්ථිකයේ ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය අඩු වනු ඇත. එලෙස ප්‍රාග්ධන භාණ්ඩ අඩුවීම හේතුවෙන් අනාගත නිෂ්පාදන හැකියාව පහළ වැටෙන අතර, ආර්ථික වෘද්ධියට එය බාධාවක් වේ. මේ අනුව වර්තමානයේ පරිභෝජනය හා අනාගත


පරිභෝජනය අතර සම්පත් වෙන් කරන ආකාරය, ආර්ථික වෘද්ධිය තීරණය කරන වැදගත් සාධකයකි. මෙය පහත පරිදි ප්‍රස්ථාර සටහනකින් පැහැදිලි කළ හැක.




ඉහත පළමු ප්‍රස්ථාරයට අනුව එම ආර්ථිකය වැඩි සම්පත් ප්‍රමාණයක් පරිබෝජනය අඳහා යොදවා ඇති බැවින් ආර්ථික වෘද්ධි අනුපාතය පහළ අගයක් ගනී. නමුත් දෙවන ප්‍රස්ථාරයට අනුව එම ආර්ථිකය පරිභෝජනයට වඩා ඉහළ සම්පත් ප්‍රමාණයක් ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදවා ඇති බැවින් ආර්ථික වෘද්ධි අනුපාතය ඉහළ අගයක් ගනී. (රූප සටහන් වලට ල.2 පැහැදිලි කිරීමට ල. 2)


iv. (අ)




(ල.1)

ආර්ථිකයක සම්පත් ඵලදායිතාව අඩුවීම හේතුවෙන්, නිෂ්පාදන හැකියාව පහළ ගොස් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ. (ල.1)


(ආ)




(ල.1)

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ගමන් කිරීමේදී Y භාණ්ඩ ප්‍රමාණය නිශ්චිත ප්‍රමාණයකින් (ඒකක 10 කින් ) වැඩිකරන විට අනෙක් භාණ්ඩයෙන් (X) කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවන තත්ත්වය වැඩෙන ආවස්ථික පිරිවැය වන අතර මෙම රූප සටහනට අනුව, ඒකක 10 ක නිෂ්පාදන ප්‍රමාණය ක්‍රමිකව වැඩි කිරීම නිසා X භාණ්ඩ ප්‍රමාණයේ නිෂ්පපාදනය වැඩිවෙන වේගයෙන් අඩුවේ .(ල.1)


(ඉ)




(ල.1)

X භාණ්ඩ සඳහා වූ අමුද්‍රව්‍ය තොගයක් පමණක් විනාශ වීම නිසා, X භාණ්ඩ නිෂ්පාදන සතු වූ සම්පත් සම්භාරය අඩුවන අතර X අක්ෂයෙන් පමණක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ. (ල.1)

(ඊ)




(ල.1)

විදේශ ණය ආයෝජන ආධාර ප්‍රමාණයේ ඉහළ යාමක් නිසා ආර්ථිකය තුළ ආයෝජන අවස්ථා පුළුල් වීමට ඉඩ ප්‍රස්ථාව වැඩිවේ. ඒ අනුව නිෂ්පාදන හැකියාව වැඩිවී, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන් වේ. (ල.1)

**02). i. සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**ii. ව්‍යාවසායකයාගෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් සඳහන් කරන්න. (ලකුණු 4)**

**iii. ආර්ථික වශයනේ කාර්යක්ෂමතාව අත්කරගත් ආර්ථිකයක දක්නට ලැබෙන ලක්ෂණ කවරේද? (ලකුණු 4)**

**iv. හිඟකම පිළිබඳ ගැටලුවට මුහුණ දෙමින් ආර්ථිකය මෙහෙය වීමේදී වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් හා විධානගත ආර්ථික පද්ධතියක් එකිනෙකින් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. ලකුණු 4)**

**v. සමාජවාදී වෙළෙඳපොළ ආර්ථිකයන් හා සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් අතර පවතින වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 4)**

02). i. - සූක්ෂම ආර්ථික විද්‍යාව යනුවෙන් හඳුන්වන්නේ ආර්ථිකය සමන්විත වී ඇති එක් එක් අංශ, ආයතන පුද්ගලයන් හා ආර්ථික විචල්‍ය ආදී කුඩා ඒකක වෙන් වෙන් වශයෙන් ගෙන ඒවායේ හැසිරීම අධ්‍යනය කිරීමයි.

- පාරිභෝගික ඉල්ලුම, නිෂ්පාදන ආයතනයක පිරිවැය, ආදී කුඩා ආර්ථික විචල්‍යයන් විශ්ලේෂණය කර අර්ථ දැක්වීම සූක්ෂම ආර්ථික විද්‍යාව අයත් වේ. (ල.2)
- සාර්ව ආර්ථික විද්‍යාවෙන් කරනුයේ ආර්ථිකය සමස්ථයක් වශයෙන් ගෙන එහි ක්‍රියාකාරීත්වය අධ්‍යනය කිරීමයි.
- ජාතික නිෂ්පාදිතය, මිල මට්ටම, උද්ධමනය, විරැකියා මට්ටම, ආර්ථික වෘද්ධිය යන මාතෘකා සාර්ව ආර්ථික විද්‍යාවට අයත් වේ. (ල.2)

ii. - අවශේෂ නිෂ්පාදන සාධක සංයෝග කර ගනිමින් නිෂ්පාදන ක්‍රියාවලියේ සංවිධානය කිරීම.
- නවෝත්පාදනය - නිෂ්පාදනය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම
- අවදානම් දැරීම (ල. 1 බැගින් ල. 4)

iii. - ආර්ථික කාර්යක්ෂමතාව අත්කරගත් ආර්ථිකයක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත කටයුතු කරන අතර, එම ආර්ථිකයට වඩාත් අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා හිඟ සම්පත් බෙදා වෙන්කර ඇත.
- මෙවැනි ආර්ථිකයක පහත ලක්ෂණ දක්නට ලැබේ.
  - නිෂ්පාදන කාර්යක්ෂමතාව අත්කර ගැනීම (පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය) (ල. 2)
  - සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව අත්කර ගැනීම. සෑම භාණ්ඩයකම ආන්තික පිරිවැය එම භාණ්ඩයේ මිලට සමාන වේ. (ල. 2)

iv.

| වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය | විධානගත ආර්ථික පද්ධතිය |
|---|---|
| - මිල යන්ත්‍රණය මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳයි. | - මධ්‍යගත සැලසුම් යන්ත්‍රණය අනුව මූලික ආර්ථික ප්‍රශ්න විසඳයි |
| - සම්පත් හිමිකාරිත්වය පෞද්ගලික අංශය සතුවේ. | - සම්පත් හිමිකාරීත්වය රජය සතුවේ. |
| - තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකේන්ද්‍රණය වී ඇත. | - තීරණ ගැනීමේ ක්‍රියාවලිය කේන්ද්‍රගත වී ඇත. |
| - දැඩි තරගයක් දක්නට ලැබේ | - තරගයක් ක්‍රියාත්මක නොවේ. |
| - ප්‍රධාන පරමාර්ථය ලාභයයි | - ප්‍රධාන පරමාර්ථය සමාජ ශුභ සාධනයයි |
| - පාරිභෝගික ස්වාධිපත්‍යයක් දක්නට ලැබේ | - පාරිභෝගික ස්වාධිත්‍යයක් දක්නට නොමැත. |

(නිවැරදි සංසන්දනයකට ල.1 බැගින් ල. 4)

v. සමාජවාදී වෙළෙඳපොල ආර්ථිකයක් යනු මූලික වශයෙන් සමාජවාදි දර්ශනයක් මත මෙහෙයවන කිසියම් දුරකට වෙළෙඳපොළ බලවේග වලට ක්‍රියාත්මක වීමට ඉඩ සලසා ඇති ආර්ථික පද්ධතියකි. (ල. 2)
සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් යනු නිෂ්පාදන සම්පත් පෞද්ගලික අංශය සතු වුවද සම්පත් භාවිතය පිළිබඳ විශාල බලපෑමක් රජයෙන් සිදුකරන ආර්ථික, දේශපාලන, සිවිල්, සමාජ, සංස්කෘතික යන මානව හිමිකම් ආරක්ෂා කිරීමට රජය මැදිහත් වන පුළුල් සමාජ ජාල ක්‍රියාත්මක කරන ආර්ථික පද්ධතියකි. (ල. 2)

**03). i.** **(අ) ඉල්ලුම යන්න නිර්වචනය කර පෞද්ගලික ඉල්ලුම වෙළඳපොළ ඉල්ලුමෙන් වෙනස් වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)**

**(ආ) වෙළඳපොළේ භාණ්ඩය සඳහා A,B,C යනුවෙන් පාරිභෝගිකයින් තිදෙනෙක් පමණක් ඇතැයි උපකල්පනය කරන්න. ඒ අනුව X භාණ්ඩය සඳහා ඇති පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිත පහත දැක්වේ.**

$Qd_A = 600 - 5Px$ $Qd_B = 1000 - 10Px$ $Qd_C = 1600 - 15Px$

**X භාණ්ඩය සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම් ශ්‍රිතය ගොඩනගන්න. (ලකුණු 2)**

**ii.** **(අ) දෙසැම්බර් මාසයේදී නත්තල් ගස්වල මිල ඉහළ ගිය අතර, විකුණන ලද නත්තල් ගස් ප්‍රමාණය ද ඉහළ ගියේය. මෙය ඉල්ලුම් නීතියට පටහැනි වූ අවස්ථාවක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 2)**

**(ආ) ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන අවස්ථාවකදී ආදායම් ස්ථාවර යැයි උපකල්පනය කෙරේ. නමුත් ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීමකට බලපාන එක් කරුණක් නම් ආදායම් ප්‍රතිවිපාකයයි. පැහැදිලි කරන්න (ලකුණු 3)**

**iii.** **(අ) ගව පාලනය සිදුකරන රටවල නියඟය හේතුවෙන් ගවමස් සපයන්නන් විශාල වශයෙන් පහළ වැටිනි. පාරිභෝගිකයෝ ආදේශකයක් ලෙස කුකුළු මස් පරිභෝජනයට යොමු වූහ. මෙම තත්ත්වය ගවමස් වෙළපොළ සැපයුම් හා ඉල්ලුම් වක්‍ර ඇසුරින් දක්වන්නේ කෙසේද? (ලකුණු 2)**

**(ආ) i. පහත දක්වා ඇති ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඇසුරින් අධි ඉල්ලුම් හා අධි සැපයුම් සමීකරණය ගොඩ නගන්න.** $Qd = 24 - 4P$ $Qs = {}^{+}4P$ **(ලකුණු 2)**

**ii. ඉහත අධි ඉල්ලුම් සමීකරණය හා අධි සැපයුම් සමීකරණය භාවිතයෙන් අධි ඉල්ලුම් මිල සහ අධි ඉල්ලුම් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)**

**iv.** **වෙළඳපොළේ ක්‍රිකට් පන්දු සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.**

$Qd = 70 - 2P$ $Qs = -14 + 5P$

**(අ) ක්‍රිකට් පන්දු සඳහා ඇති වෙළඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)**

**(ආ) වෙළඳපොළ සමතුලිත අගයන්හි දී මිල ඉල්ලුම් සහ මිල සැපයුම් නම්‍යතා අගයන් ගණනය කරන්න.(ල 2)**

03). i. (අ) නිශ්චිත කාලයක් තුළ ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩය සඳහා වූ විවිධ මිල ගණන් යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කරන විවිධ ඉල්ලුම් ප්‍රමාණ ඉල්ලුම ලෙස හැඳින්වේ. (ල. 1)

නිශ්චිත කාලයක් තුළදී වෙළඳපොලේ සිටින එක් ගැනුම්කරුවකු විසින් සලකා බලන භාණ්ඩයට පවතින විකල්ප මිල යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණ පෞද්ගලික ඉල්ලුම ලෙස හැඳින්වේ. (ල. 1)

නිශ්චිත කාලයක් තුළදී වෙළඳපොලේ සිටින සියලුම ගැනුම්කරුවන් විසින් සලකා බලන භාණ්ඩය සඳහා පවතින විකල්ප මිල ගණන් යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කරන විවිධ ඉල්ලුම් ප්‍රමාණවල එකතුව වෙළඳපොළ ඉල්ලුම ලෙස හැඳින්වේ. (ල. 1)

(ආ) $Qd_m = Qd_A + Qd_B + Qd_C$

$Qd_m = (600 - 5Px) + (1000 - 10Px) + (1600 - 15Px)$


$Qd_m = 600 - 5Px + 1000 - 10Px + 1600 - 15Px$

$Qd_m = 3200 - 30Px$ (ල. 2)

ii. (අ) නැත. මෙහිදී ඉල්ලුම් වක්‍රය මත ගමන් කිරීමක් සිදු නොවේ. දෙසැම්බර් මාසයේදී නත්තල් ගස් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම හේතුකොට ගෙන ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. මේ හේතුවෙන් නත්තල් ගස් සඳහා ඇති මිල සහ ප්‍රමානය යන දෙකම වැඩිවේ (ල. 2)

(ආ)
- ඉල්ලුම් වක්‍රයක් නිර්මාණය කිරීමේදී අදාල භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක ස්ථාවර යැයි උපකල්පනය කෙරේ. එම නිසා අදාල භාණ්ඩයේ මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිවිරුද්ධ සම්බන්ධතාවයක් ඇත. (ල. 1)
- ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම ඉල්ලුම සඳහා බලපාන අනෙකුත් සියළු සාධක ස්ථාවරව පවතින විට අදාල භාණ්ඩයේ මිල වෙනස්වීම මත සිදුවේ.
- මෙසේ සියළු සාධක ස්ථාවරව පවතින විට මිලෙහි පමණක් වන්නා වූ වෙනස්වීම මත ඉල්ලුම් ප්‍රමාණයේ සිදුවන වෙනස මිල වෙනස්වීමේ ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය මත සිදුවේ. (ල. 1)
- ආදායම් ප්‍රතිවිපාකය මගින් මිල වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායම වෙනස්වීම හේතුකොටගෙන අදාල භාණ්ඩය සඳහා කරන ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම සාකච්ඡා කෙරේ. ඒ අනුව මිල අඩුවීමකදී පාරිභෝගික මූර්ත ආදායම ඉහළ යනු ඇත. බාල භාණ්ඩ සම්බන්ධයෙන් අදායම් ප්‍රතිවිපාකය ඍණ වුවද සාමාන්‍යයෙන් මෙය ධන අගයක් ගනී. (ල. 1)

iii. (අ) සැපයුම් වක්‍රය නියගය හේතුවෙන් සැපයුමේ අඩුවීම පෙන්නුම් කිරීම සඳහා වමට විතැන් විය යුතුය.මේ හේතුවෙන් ගව මස්වල මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝජනය කරන්නා වූ ප්‍රමාණය පහළ යනු ඇත. මෙහි දී ඉල්ලුම් වක්‍රයේ චලනය වීමක් සිදු නොවේ. සැපයුම් වක්‍රය වමට විතැන් වීම හේතුකොට ගෙන ගව මස්වල මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම් ප්‍රමාණය අඩු වී ඇත. (ල. 1)




(ල. 1)

(ආ) i. අධි ඉල්ලුම් සමීකරණය

$Qd_{Exd} = Qd - Qs$

$= (24 - 4P) - (4P)$

$= 24 - 4P - 4P$

$\mathbf{Qd_{Exd} = 24 - 8P}$ (ල. 1)

අධි සැපයුම් සමීකරණය

$QS_{Ex} = Qs - Qd$

$= 4P - (24 - 4P)$

$= 4P - 24 + 4P$

$= 8P - 24$

$\mathbf{QS_{Ex} = -24 + 8P}$ (ල. 1)

ii. $Qd_{Ex} = Qs_{Ex}$

$24 - 8P = -24 + 8P$

$24 + 24 = 8P + 8P$

$48 = 16P$

$\frac{48}{16} = P$

$3 = P$

**අධි ඉල්ලුම් මිල = රු. 3 /-** (ල. 1)

$Qd = 24 - 8P$

$Qd = 24 - 8 \times 3$

$Qd = 24 - 24$

$Qd = O$

**අධි ඉල්ලුම් ප්‍රමාණය = 0** (ල. 1)

iv. (a) Qd = Qs

70 – 2P = -14 + 5P

70 + 14 = 5P + 2P

84 = 7 P

$\frac{84}{7}$ = P **12 = P** (ල. 1)

Qd = 70 – 2P

Qd = 70 – 2 x 12

Qd = 70 - 24

**Qd = 46** (ල. 1)

(b) මිල ඉල්ලුම් නම්‍යතාවය

$Ped = \frac{\Delta Qd}{\Delta P} X \frac{P}{Qd}$

$= -2 x \frac{12}{46} = \mathbf{-0.52}$ (ල. 1)

මිල සැපයුම් නම්‍යතාවය

$Pes = \frac{\Delta Qs}{\Delta P} X \frac{P}{Qs}$

$= 5 x \frac{12}{46} = \mathbf{1.30}$ (ල. 1)

**04). එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් වූ වෙළඳපල ඉල්ලුම් හා සැපයුම් ලේඛනය පහත පරිදි වේ.**

| **මිල** | **ඉල්ලුම් ප්‍රමාණය** | **සැපයුම් ප්‍රමාණය** |
|---|---|---|
| 2 | 50 | 10 |
| 4 | 40 | 20 |
| 6 | 30 | 30 |
| 8 | 20 | 40 |

**i.** **ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ආශ්‍රයෙන් වෙළෙඳපල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.(ලකුණු 4)**

**ii.** **මෙම භාණ්ඩය මත රජය විසින් රු. 4.00 ක උපරිම මිලක් නියම කලහොත් වෙළඳපොල තුළ ඇතිව**

**(අ) අධි ඉල්ලුම ගණනය කරන්න. (ලකුණු 2)**

**(ආ) කළු කඩ මිල ගණනය කරන්න (ලකුණු 2)**

**(ඇ) අහිමිවන සමාජ ශුභ සාධනය ගණනය කරන්න. (ලකුණු 2)**

**(ඉ) උපරිම මිලට පෙර හා පසු ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)**

**iii.** **උපරිම මිල නියම කිරිම වෙනුවට, මෙම වෙළඳපෙල වෙත රු. 10 ක අවම මිලක් නියම කිරීම සඳහා රජය තීරණය කළේ යැයි සිතන්න.**

**(අ) අවම මිල සීමා නියම කිරීමෙහි ආර්ථික ප්‍රතිවිපාක දක්වන්න. (ලකුණු 4)**

**(ආ) අවම මිල අර්ථවත් කිරීම සඳහා රජය අනුගමනය කරන ඌණ පූර්ණ ගෙවීමේ ප්‍රතිපත්තිය අනුව රජයට දැරීමට සිදුවන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 4)**

04).

i Qd = a – bp

50 = a – 5 x 2

50 = a – 10

60 = a **Qd = 60 – 5P** (ල. 2)

$b = \frac{\Delta Qd}{\Delta P} = \frac{10}{2} = -5$

Qs = a + bp

10 = a + 5 x 2


10 = a + 10

0 = a **Qs = 5P** (ල. 2)

$b = \frac{\Delta Qs}{\Delta P} = \frac{10}{2} = 5$

ii

**(අ)**




Qs = 5P

= 5 x 4

**= 20**

Qd = 60 – 5P

= 60 – 5x 4

= 60 – 20 **= 40** (ල. 1)

අධි ඉල්ලුම = 40 – 20 **= 20** (ල. 1)

**(ආ) කලු කඩ මිල** Qd = 60 – 5P

20 = 60 – 5P

5P = 40 **P = 8** (ල. 2)

**(ඇ)** අහිමි වන සමාජ ශුභ සාධනය $= \frac{(8-4) x 10}{2}$ = 4 x 5 **= 20** (ල. 2)

(ඉ) <u>පෙර</u>

පාරිභෝගික අතිරික්තය $= \frac{6 \times 30}{2}$ $= \underline{\underline{90}}$

නිෂ්පාදන අතිරික්තය $= \frac{6 \times 30}{2}$ $= \underline{\underline{90}}$

ආර්ථික අතිරික්තය $= 90 + 90$ $= \underline{\underline{180}}$

උපරිම ඉ. මිල $= 60 - 5P$

$5P = 60$

$P = 12$

(ල. 2)

<u>පසු</u>

පාරිභෝගික අතිරික්තය $= \frac{4 \times 20}{2}$ $\underline{\underline{= 40}}$


නිෂ්පාදන අතිරික්තය $= \frac{4 \times 20}{2}$ $\underline{\underline{= 40}}$

ආර්ථික අතිරික්තය $= 40 + 40$ $= \underline{\underline{80}}$

iii.

(අ) 1. අතිරික්ත නිෂ්පාදනය වෙළඳපොලෙහි ගොඩගැසීම හෙවත් තොග සමුච්ඡනය වීම.
2. සේවා සම්බන්ධයෙන් ගත් කල විරැකියාව වැනි ගැටළු ඇතිවීම
3. වෙළඳුන් නීතියෙන් පලා යැමට තැත් කිරීම.
(අවම මිල නාමික මිලක් සේ සලකා අඩු මිලට භාණ්ඩ අලෙවි කිරීම)
4. අධි ආයෝජන තත්ත්වයක් උද්ගත වීම
5. පාරිභෝගික අතිරික්තයට, නිෂ්පාදන අතිරික්තයට බලපෑම් ඇති වී සමාජ ශුභ සාධනයට බලපෑම් ඇති වීම. (කරුණකට ල. 1 බැගින් ල. 4)

(ආ)




$Qs = 5P$
$= 5 \times 10$
$\underline{\underline{= 50}}$

$Qd = 60 - 5P$
$50 = 60 - 5P$
$5P = 10$
$\underline{\underline{P = 2}}$

ඌණ පූර්ණ ප්‍රතිපත්තියට අනුව රජයට දැරීමට සිදුවන පිරිවැය $= 8 \times 50$

= රු. 400.00 (ල. 4)

**05). එක්තරා වෙළඳපලක සමතුලිත මිල රු. 5.00 ලෙසද සමතුලිත ප්‍රමාණය 100 ක් ලෙස ද පාරිභෝගික අතිරික්තය රු. 1000.00 ලෙස ද නිෂ්පාදන අතිරික්තය රු. 200.00 ක් ලෙස ද උපකල්පනය කරන්න.**


**i. මෙම වෙළඳපලට අදාල උපරිම ඉල්ලුම් මිල හා අවම සැපයුම් මිල (ලකුණු 4)**

**ii. මෙම වෙළඳපලට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩනගන්න. (ලකුණු 4)**

**iii. මෙම වෙළඳපල මත රු. 6.00 ක ඒකක බද්දක් පැනවීමට රජය තීරණය කළේ නම්,**
- **(අ) නව සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)**
- **(ආ) බද්දෙන් පසු පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)**
- **(ඉ) අධි බදු බර කොපමණද? (ලකුණු 2)**

**iv. මෙම නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා පනවා තිබූ බද්ද ඉවත්කොට රු. 3 ක ඒකක සහනාධාරයක් ලබා දීමට රජය කටයුතු කරන්නේ නම්, සහනාධාරයෙන් පසු,**
- **(අ) පාරිභෝගික අතිරික්තයේ ඇතිවන වෙනස ගණනය කරන්න. (ලකුණු 2)**
- **(ආ) සහනාධාරය සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? (ලකුණු 2)**
- **(ඇ) අහිමිවන සමාජ ශුභ සාධනය ගණනය කරන්න. (ලකුණු 2)**

05).



i. පාරිභෝගික අතිරික්තය = $\frac{\text{(උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල) x සමතුලිත ප්‍රමාණය}}{2}$

$$1000 = \frac{(x-5) \times \cancel{100}^{50}}{\cancel{2}}$$

$$1000 = 50x - 250$$

$$1250 = 50x$$

$$\frac{125\cancel{0}}{5\cancel{0}} = x$$

$$25 = x$$

උපරිම ඉල්ලුම් මිල රු. 25 /- (ල.2)

නිෂ්පාදන අතිරික්තය = $\frac{\text{(සමතුලිත මිල - අවම සැපයුම් මිල) x සමතුලිත මිල}}{2}$

$$200 = \frac{(5-Y) \times \cancel{100}^{50}}{\cancel{2}}$$

$$200 = 250 - 50y$$

$$50y = 50$$

$$y = 1$$

අවම සැපයුම් මිල රු. 1.00 /- (ල.2)

ii. $Qd = a - bP$

| මිල | ඉ.ප්‍ර |
|---|---|
| 25 | 0 |
| 5 | 100 |

$b = -\frac{\Delta Qd}{\Delta P} = -\frac{100}{20} = 5$

$100 = a - 5 \times 5$

$100 = a - 25$

$125 = a$

**Qd = 125 – 5P** (ල. 2)

$QS = a + bP$

| මිල | සැ.ප්‍ර |
|---|---|
| 1 | 0 |
| 5 | 100 |

$b = \frac{\Delta Qs}{\Delta P} = \frac{100}{4} = 25$

$100 = a + 25 \times 5$

$100 = a + 125$

$-25 = a$

**Qs = -25 + 25P** (ල. 2)

iii.

**(අ)** $Qd = Qs$

$125 - 5P = -25 + 25(p - t)$

$= -25 + 25(P - 6)$

$= -25 + 25P - 150$

$125 - 5P = -175 + 25P$

$300 = 30P$

**10 = P**

$Qs = -175 + 25P$

$= -175 + 25(10)$

$= -175 + 250$

$=$ **75**

**නව සමතුලිත මිල රු. 10.00**


**නව සමතුලිත ප්‍රමාණය 75** (ල. 2)

**(ආ)** පාරිභෝගික අතිරික්තය $= \frac{(25-10) \times 75}{2}$ $= 562.5$ (ල. 1)

නිෂ්පාදන අතිරික්තය $= \frac{(4-1) \times 75}{2}$ $= 112.5$ (ල. 1)

**(ඉ)** අධි බදු බර $= \frac{6 \times 25}{2}$ $= 75$ (ල. 2)

iv.




$Qd = Qs$

$125 - 5P = -25 + 25(P+S)$

$= -25 + 25(P + 3)$

$= -25 + 25P + 75$

$125 - 5P = 50 + 25P$

$75 = 30P$

**2.5 = P**

$Qd = 125 - 5P$

$= 125 - 5(2.5)$

$= 125 - 12.5$

$=$ **112.5**

**(අ)** පාරිභෝගික අතිරික්තයේ වෙනස $= \frac{2.5 \times (112.5+100)}{2}$

$= \frac{2.5 \times 212.5}{2}$

$\underline{= 265.625}$ (ල. 2)

**(ආ)** රජයේ සහනාධාර පිරිවැය = රු. 3 x 112.5

= <u>රු. 337.5</u> (ල. 2)

**(ඇ)** අහිමිවන සමාජ ශුභ සාධනය $= \frac{(5.5-2.5) \times 12.5}{2}$

$= \frac{3 \times 12.5}{2}$

$\underline{= 18.75}$ (ල. 2)

<u>ආ කොටස</u>

**06). i. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතය හඳුන්වන්න. (ලකුණු 4)**

**ii. පහත සඳහන් පිරිවැය ස්ථාවර පිරිවැයට අයත් වේද? විචල්‍ය පිරිවැයට ඇතුළත් වේද?**

**අ) ප්‍රමාණික ලාභ ආ) වැටුප් ගෙවීම්**

**ඇ) ප්‍රධාන විධායක නිලධාරී වැටුප ඉ) ප්‍රවාහන වියදම් හා විදුලිබල ගාස්තු (ල. 1 බැගින් ල. 4)**

**iii. නිෂ්පාදන ආයතනයක් දිගුකාලයේදී ලබන ඵලදාව එම ආයතනයේ සාමාන්‍ය පිරිවැය වක්‍රය සමඟ සම්බන්ධ වන්නේ කෙනේද? රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**iv. ''පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙයි'' මෙයින් අදහස් කරන්නේ කුමක්ද? මේ සඳහා බලපාන හේතු කවරේද? (ලකුණු 4)**

**v. කෙටි කාලයේහි නිෂ්පාදනයේ නිරතව සිටින ආයතනයක් ඒකකයක් මිල රු. 10 ක මිලට ඒකක 100 ක් අලෙවි කරයි. මෙම ආයතනයේ මුළු පිරිවැය රු. 1200 ක් වන අතර, මුළු ස්ථාවර පිරිවැය රු. 400 කි. මෙවැනි තත්ත්වයක් යටතේ මෙම ආයතනය නිෂ්පාදනයේ රැඳී සිටිය යුතු ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 4)**

06). i. - කර්මාන්ත ශාලාවේ ස්ථාවර යෙදවුම් නොවෙනස්ව තිබියදී විචල්‍ය යෙදවුම් වෙනස් කරමින් නිෂ්පාදනය සිදුකරන විට යෙදවුම් හා නිමැවුම් අතර පවත්නා තාක්ෂණික සබඳතාව කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් පෙන්නුම් කෙරේ.

කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතය $Q = F\,(V_1, V_2, V_3 \ldots\ldots V_n, K)$ලෙස දැක්විය හැකිය. (ල. 2)


- නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ සියලු යෙදවුම් වෙනස් කරන විට යෙදවුම් හා නිමැවුම් අතර පවතින තාක්ෂණික සබඳතාව දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් දැක්වේ. එය පහත පරිදි වේ.

$Q = F\,(V_1, V_2, \ldots\ldots\ldots . V_n, K_1, K_2, \ldots\ldots . K_n)$ (ල. 2)

ii. අ) ස්ථාවර පිරිවැය ආ) විචල්‍ය පිරිවැය ඇ) ස්ථාවර පිරිවැය ඉ)විචල්‍ය පිරිවැය (ල. 1 බැගින් ල. 4)

iii. - දිගුකාලයේදී ලබන ඵලදාව පරිමාණානුකූල ඵල නීතියට යටත් වන අතර දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පැතලි U අකුරේ හැඩය ගන්නේ පරිමාණානුකූල පිරිමැසුම් හා නොපිරිමැසුම් නිසාය.

- ධාරිතාව ප්‍රසාරණය කරන විට හට ගන්නා වැඩෙන පරිමාණානුකූල ඵල නිසා සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළ බසින අතර ධාරිතාව ප්‍රසාරණය කරන විට හට ගන්නා අඩුවන පරිමාණානුකූල ඵල නිසා සාමාන්‍ය පිරිවැය වක්‍රය ඉහළ නගී. ධාරිතාව ප්‍රසාරණය කරන විට හට ගන්නා ස්ථාවර පරිමාණානුකූල ඵල නිසා සාමාන්‍ය පිරිවැය නොවෙනස්ව පවතී. (ල. 2)




(රූපසටහනට ල. 2)

iv. පූර්ණ තරගකාරී ආයතනයක් පවත්නා වෙළෙඳපොල මිලට ආයතනය කැමති ඕනෑම ප්‍රමාණයක් අලෙවි කළ හැකි බැවින් ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ. (ල. 2)

මේ සඳහා බලපාන හේතු

- නිෂ්පාදිතය සමජාතීය වීම
- ආයතනයේ සැපයුම වෙළඳපොල මුළු සැපයුමෙන් අතිශයින් කුඩා ප්‍රමාණයක් වීම
- ගැනුම්කරුවන් වෙළඳපොල මිල පිළිබඳව පූර්ණ දැනුමකින් කටයුතු කිරීම (ල. 2)

v. නිෂ්පාදනයේ රැඳී සිටිය යුතුය


- අලාභ ලබන බැවින් වසා දැමීමට තීරණය කරනු ලැබුවහොත් සිදුවිය හැකි පාඩුව මුළු ස්ථාවර පිරිවැය වන රු. 400 ක් වේ. නමුත් ආයතනය නිෂ්පාදනයේ රැඳී සිටියහොත් හට ගන්නා පාඩුව රු. 200 කි. හේතුව ආයතනය ලබන අයභාරය විචල්‍ය පිරිවැය සම්පූර්ණයෙන්ම ආවරණය කරගෙන ස්ථාවර පිරිවැයෙන් යම් ප්‍රමාණයක් හෝ ආවරණය කර ගැනීමට හැකිවන බැවිනි. එබැවින් මුළු අලාභය අවම කර ගැනීම සඳහා නිෂ්පාදනයේ නිරත වීම ලාභ උපරිම කර ගැනීමට හේතු වේ. (නිවැරදි පැහැදිලි කිරීමට ල. 4)

**07). i. නිෂ්පාදන සාධක වෙළඳපොළ හා භාණ්ඩ වෙළෙඳපොල අතර දක්නට ලැබෙන වෙනස්කම් කවරේද?(ලකුණු 4)**

**ii. ''ප්‍රමාණික ලාභ, සංක්‍රාම ඉපයීමක් වේ'' මෙම ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න. (ලකුණු 4)**

**iii. ඒකකාධිකාරී වෙළඳපොළ හා කතිපයාධිකාරී වෙළඳපොළ අතර දක්නට ලැබෙන සමානකම් හා අසමානකම් 2 බැගින් සඳහන් කරන්න. (ලකුණු 4)**

**iv. පූර්ණ තරගකාරී වෙළඳපොළක් තුළ කටයුතු කරන නිෂ්පාදන ආයතනයක කෙටිකාලීන හැසිරීම පහත රූප සටහන පෙන්නුම් කරයි.**




**(අ)ඒකකයක වෙළඳපොල මිල රු. 30 ක් වේ නම් ලාභ උපරිම කෙරෙන නිමවුම් මට්ටම කොපමණද? (ලකුණු 2)**

**(ආ)එම මිලේදී ආයතනය ඒකකයකට ලබන ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 2)**

**(ඉ)මෙම ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණද? (ලකුණු 2)**

**(උ)ආයතනය නිෂ්පාදනය අත්හිටුවීමට තීරණය කරන මිල කොපමණද? (ලකුණු 2)**

07). i.

- නිෂ්පාදන සාධක විකිණීමත් මිලට ගැනීමත් සිදු කෙරෙන වෙළෙඳ පොළ සාධක වෙළෙඳපොළයි. භාණ්ඩ හා සේවා හුවමාරු වන වෙළඳපොල භාණ්ඩ වෙළෙඳපොළයි.
- සාධක සඳහා වක්‍ර (ව්‍යුත්පන්න) ඉල්ලුමක් පවතින අතර, භාණ්ඩ සඳහා පවතින්නේ ඍජු ඉල්ලුමකි. සාධක මිලදී ගන්නන් නිෂ්පාදන ආයතන වන අතර භාණ්ඩ මිලදී ගන්නන් පාරිභෝගිකයන් ය.
- සාධක සැපයුම් කරුවන් වන්නේ කුටුම්භ අංශය වන අතර, භාණ්ඩ සැපයුම් කරන්නේ නිෂ්පාදන ආයතනය (කරුණකට ල. 1 බැගින් ල. 4)

ii.

- සංක්‍රාම ඉපයුම් යනු කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීම සඳහා එම සාධකය අපේක්ෂා කරන අවම මිලයි.
- ප්‍රමාණික ලාභ යනු ව්‍යවසායකයකු පවත්නා නිෂ්පාදන ක්‍රියාවලියෙහි රඳවා තබා ගැනීම සඳහා එම ව්‍යවසායකයා, අපේක්ෂා කරන අවම ගෙවීමයි.
- පවත්නා නිෂ්පාදන ක්‍රියාවලිය තුළ එම අවම ගෙවීම වත් ඔහුට උපයා ගත නොහැකි නම් ඔහු තම ව්‍යවසායකත්වය එම ව්‍යාපාරයෙන් ඉවත් කරගනී.
- එබැවින් ව්‍යවසායකත්ව කාර්යයේ රැඳී සිටීම සඳහා ඔහු බලාපොරොත්තු වන අවම මිල වන ප්‍රමාණික ලාභ ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධකයේ සංක්‍රාම ඉපයීම වේ. (කරුණකට ල. 1 බැගින් ල. 4)

iii. **සමානතා**

- ආයතනයේ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වේ. - දිගු කාලයේ දී නිෂ්ප්‍රමාණික ලාභ ලබයි
- ප්‍රවේශය බාධාකාරී වේ. (කරුණකට ල. 1 බැගින් ල. 2)

**අසමානතා**

- ඒකාධිකාරී වෙළෙඳපොලේ නිෂ්පාදිතය සුවිශේෂි වන අතර කතිපයාධිකාරී ආයතනයේ නිෂ්පාදිතය සමජාතිය හෝ ප්‍රභේදිත වේ.
- ඒකාධිකාරී වෙළෙඳපොළේ එක් ආයතනයක් පවතින අතර, කතපයාධිකාරී වෙළෙඳපොලේ ආයතන අතලොස්සක් පවතී. (කරුණකට ල. 1 බැගින් ලකුණු 2)

iv. (අ) ඒකක 300 කි. (ල. 2)

(ආ) ඒකකයක වෙළෙඳපොළ මිල - ඒකකයක නිෂ්. පිරිවැය

රු. 30 - රු. 20 = **<u>රු. 10</u>**

ඒකකයකට ලබන ලාභය රු. 10 කි (ල. 2)

(ඉ) ඒකක 150 දී TC = රු. 3750

ඒකක 150 දී TVC = රු. 750

ඒකක 150 දී TFC = රු. 3000 (ල. 2)

(උ) නිෂ්පාදනය අත්හිටුවීමට තීරණය කරන මිල රු. 5 කි (ල. 2)

**08). i. ආර්ථික පසු බැසීම යනුවෙන් කුමක් අදහස්වේද? (ලකුණු 2)**

**ii. ආර්ථිකයක විභව නිමැවුම යන්න නිර්වචනය කරන්න. (ලකුණු 2)**

**iii. රටක ආර්ථික කාරක නම් කරන්න. (ලකුණු 4)**

**iv. ජාතික ගිණුම්කරණයේදී නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු ස්වරූප දෙක පැහැදිලි කරන්න. (ල. 4)**
**v. (අ) දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් නොවන ඵලදායී කටයුතු මොනවාද? (ලකුණු 5)**
**(ආ) දේශීය නිමැවුම ගණනය කිරීමේදී බැහැර කෙරෙන ඵලදායී නොවන ගණුදෙනු මොනවාද?(ල. 3)**

08). i. - ආර්ථික පසුබැසීම යනු කෙටිකාලීන, එනම් කාර්තු දෙකකට වඩා අඩු කාලයකදී ආර්ථිකයේ භාණ්ඩ හා සේවා සඳහා සමස්ත ඉල්ලුම අඩුවී නිෂ්පාදනය අඩුවීම මගින් ආර්ථිකයේ ඇතිවන පසුබැසීමයි.
- ආර්ථික පසුබැසීම තුළින් සේවා වියුක්තිය ඉහළයයි. නිෂ්පාදන හැකියා වක්‍රයේ ලක්ෂයකින් ඇතුලට විතැන්වීමක් මගින් මෙය පෙන්නුම් කරයි. (ල. 2)

ii. විභව නිමවුම යනු ආර්ථියක සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් උපයෝජනය කළ විට උද්ධමන පීඩනයකින් තොරව ලබාගත හැකි උපරිම වූත් තිරසර වූත් නිමවුම් මට්ටමයි. (ල. 2)

iii. - කුටුම්බ අංශය - ව්‍යාපාරික අංශය - රාජ්‍ය අංශය - විදේශ අංශය (ල.4)

iv. - නීතියෙන් තහනම් කොට ඇති භාණ්ඩ හා සේවා නිපදවීම හා බෙදාහැරීම
උදා - මත්පැන්, මත් ද්‍රව්‍ය, ගණිකා වෘත්තිය, තහනම් භාණ්ඩ ප්‍රවාහනය
- ඇතැම් නිත්‍යානුකුල භාණ්ඩ හා සේවා නිත්‍යානුකුල නොවන හා ලියාපදිංචිය නොලත් පුද්ගලයන් විසින් නිපදවීම
උදා - ලියාපදිංචිය නොලත් වෛද්‍ය සේවය (ලකුණු 4)

v) (අ) - ගෙවීමකින් තොරව නිවසතුල ඉටු කරනු ලබන ගෘහ සේවය
- නොමිලයේ ලැබෙන ස්වාභාවික සම්පත් (ජලය, වාතය)
- මිනිස් ශ්‍රමයකින් තොරව වර්ධනය වන ස්වාභාවික සම්පත් (වනාන්තර)
- ඉගෙනීම හා විවේකය
- මිල වෙනස්වීමෙන් ස්වාභාවික වර්ධනය මගින් සම්පත් වල සිදුවන වටිනාකමේ වෙනස්වීම (ල. 5)

(ආ) - ඵලදායී නොවන වෙළඳපොළ ගනුදෙනු - සංක්‍රාම
- මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු - පාවිච්චි කල භාණ්ඩ විකිණීම ආශ්‍රිත ගනුදෙනු (ල. 3)

**09). i. සමස්ත ආර්ථික ප්‍රදේශයක් තුළ සිටින ප්‍රධාන ආයතනික ඒකක මොනවාද? (ලකුණු 3)**
**ii. නව ජාතික ගිණුම්කරණ ප්‍රවේශයට අනුව ශ්‍රී ලංකාවේ දළදේශීය ආදායම් සංරචක නම් කරන්න. (ල. 3)**
**iii. ජාතික ගිණුම් පිළියෙළ කිරීමේදී පවතින සීමා ලෙස ඔබ සලකනු ලබන්නේ කුමන ආකාරයේ සීමාවන්ද?(ල.4)**
**iv. පහත දැක්වෙන්නේ ජාතික ගිණුම් පිළිබඳ දත්ත සමහරකි.**

| | |
|---|---|
| **- කුටුම්බ පරිභෝජනය** | **750** |
| **- ස්ථාවර ප්‍රාග්ධනය** | **800** |
| **- වටිනාකමේ වෙනස්වීම්** | **300** |
| **- තොග වෙනස්වීම්** | **500** |
| **- ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්භ වෙත සපයන සේවා** | **200** |
| **- රජයේ පරිභෝජනය** | **50** |
| **- අපනයන** | **1000** |
| **- ආනයන** | **600** |
| **- විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම්** | **1600** |
| **- විදේශ ශුද්ධ ජංගම සංක්‍රාම** | **500** |
| **- විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම්** | **1800** |

**පහත සඳහන් දෑ ගණනය කරන්න.**
**(අ) අවසාන පරිභොජන වියදම**
**(ආ) වෙළඳ මිලට දළ දේශීය වියදම**
**(ඇ) වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය**
**(ඈ) වෙළඳ මිලට දළ ජාතික ආදායම**
**(ඉ) වෙළඳ මිලට වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 2 බැගින් ලකුණු 10)**

09). i. - මූල්‍ය නොවන සමාගමික අංශය - මූල්‍ය සමාගමික අංශය - රාජ්‍ය අංශය
- ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය - ගෘහ ඒකක අංශය
(කරුණු 3 කට ල. 3)

ii. - සේවක ආදායම්
- දළ මෙහෙයුම් අතිරික්තය (ශුද්ධ මෙහෙයුම් අතිරික්ත, ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය)
- මිශ්‍ර ආදායම් - නිෂ්පාදනය මත වෙනත් බදු - සහනාධාර (ල. 3)

iii. - ගෙවීමකින් තොරව නිවස තුළ ඉටුකරන සේවා ඇතුලත් නොවීම
- ගෘහනියන්ගේ සේවා ඇතුළත් නොවීම - බාහිරතා සැලකිලිමත් නොවීම
- විවේකය ඇතුලත් නොවීම - රාජ්‍ය ණය පොලී ඇතුලත් නොවීම (ල. 4)

(අ) අවසාන පාරිභෝජන වියදම

| | |
|---|---|
| - කුටුම්බ පාරිභෝජන වියදම | 750 |
| - ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්බ වෙත සපයන සේවා | 200 |
| - රාජ්‍ය පාරිභෝජන වියදම | 50 |

| | | | |
|---|---|---|---|
| | | 1000 | (ල. 2) |
| (ආ) - අවසාන පාරිභෝජන වියදම | | 1000 | |
| - දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | | 1600 | |
| - ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 800 | | |
| - තොග වෙනස්වීම් | 500 | | |
| - වටිනාකමේ වෙනස්වීම් | 300 | | |
| වෙළඳමිලට දළ දේශීය වියදම | | 2600 | (ල. 2) |

| | | |
|---|---|---|
| (ඇ) දළ දේශීය වියදම | 2600 | |
| - අපනයන | 1000 | |
| - ආනයන | (600) | |
| වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදනය | 3000 | (ල.2) |

| | | |
|---|---|---|
| (ඈ) වෙළඳ මිලට | | |
| - දළ දේශීය නිෂ්පාදිතය | 3000 | |
| විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම් | 1600 | |
| විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම් | (1800) | |
| වෙළඳ මිලට දළ ජාතික ආදායම | 2800 | (ල. 2 ) |

| | | |
|---|---|---|
| (ඉ) වෙළඳ මිලට දළ ජාතික ආදායම | 2800 | |
| විදේශ ශුද්ධ ජංගම සංක්‍රාම | 500 | |
| වෙළඳ මිලට වැය කළ හැකි ද. ජා. ආ. | 3300 | (ල. 2 ) |

**10). i. සාර්ව ආර්ථික සමතුලිතය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 3)**

**ii. සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි විවිධ ප්‍රවේශ නම් කරන්න. (ලකුණු 3)**

**iii. C = 100 + 0.75 Y යන පරිභෝජන ශ්‍රිතය ඔබට දී ඇතැයි සිතන්න**

**(අ) එම පරිභෝජන ශ්‍රිතයට අදාළ ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 2)**

**(ආ) ඉතුරුම් ශූන්‍ය වන අවස්ථාවේ ආදායම කොපමණද? (ලකුණු 2)**

**(ඇ) එම ආදායම් මට්ටමේදී මුළු පරිභෝජනය සොයන්න. (ලකුණු 2)**

**iv. ආන්තික පරිභෝජන නැමියාව හා සාමාන්‍ය පරිභෝජන නැමියාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)**

**v. පහත දැක්වෙන ආර්ථික තොරතුරු ඇසුරෙන් සාර්ව ආර්ථික සමතුලිතය ආදායම් වියදම් ප්‍රවේශය මගින් ගණනය කරන්න. (ලකුණු 4)**

| | |
|---|---|
| **පරිභෝජන ශ්‍රිතය** | **C = 400+ 0.8 Yd** |
| **ආයෝජන වියදම්** | **I = 100** |
| **රාජ්‍ය වියදම්** | **G = 200** |
| **ශුද්ධ අපනයන** | **X - M = - 100** |
| **ස්වාධීන බදු** | **T = 150** |

10). i. - සාර්ව ආර්ථික සමතුලිතය යනු සමස්ත නිමැවුමේ වටිනාකමට සමාන සමස්ත ඉල්ලුමක් පවතින අවස්ථාවයි. මෙහිදී සමස්ත ඉල්ලුම සපුරාලීමට සමත් සමස්ත සැපයුමක් පවතී.

- ආර්ථික සමතුලිතයේදී සමස්ත නිමැවුමත් සමස්ත සේවා නියුක්ති මට්ටමත් උච්චාවචනය නොවී පවත්නා මට්ටමෙහි පවතී. (ල. 2 )
- සමස්ත ඉල්ලුම සපුරාලීමට සමත් සමස්ථ සැපයුමක් ඇති නොවන අවස්ථාව සාර්ව ආර්ථික අසමතුලිතයයි.

(ල. 1 ) (කරුණකට ලකුණු 1 බැගින් මුළු ලකුණ 3)

ii. - සමාහාර ආදායම් = සමාහාර වියදම් ප්‍රවේශය
- කාන්දුවීම් = විදීම් ප්‍රවේශය
- සමාහාර ඉල්ලුම = සමාහාර සැපයුම් ප්‍රවේශය (ලකුණු 3)

iii. (අ) C = 100 + 0.75 Y

S = Y – C

S = Y – (100 + 0.75 Y)

S = Y – 100 – 0.75 Y

S = - 100 + Y – 0.75 Y

S = -100 + (1 – 0.75)Y

**S = - 100 + 0.25 Y** (ඉතුරුම් ශ්‍රිතය නිවැරදිව ලියා ඇත්නම් (ලබාගත් ක්‍රමය නැතුව) ල. 2 ක් හිමිවේ)

(ආ) ඉතුරුම් ශූන්‍ය වන විට ආදායම

S = -100 + 0.25 Y

0 = -100 + 0.25 Y

100 = 0.25 Y

$Y = \frac{100}{0.25}$

**<u>Y = 400</u>** (ල.2)

(ඇ) මුළු පරිභෝජනය

C = 100 + 0.75 Y

C = 100 + 0.75 x 400

C = 100 + 300

**<u>C = 400</u>** (ල.2) ගණනය කිරීම අවශ්‍ය වේ.

iv. - ආන්තික පරිභෝජන නැමියාව යනු වැයකළ හැකි ආදායම වෙනස්වීමට සාපේක්ෂව පරිභෝජනය වෙනස් වන අනුපාතයයි. එනම් ආදායම එක් ඒකකයකින් වෙනස් වන විට පරිභෝජනය කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේද යන්නයි.

- පරිභෝජන ශ්‍රිතයේ b වලින් පෙන්නුම් කරන්නේ ආන්තික පරිභෝජන නැමියාවයි.

$b = MPC = \frac{\Delta C}{\Delta Y}$ (ල.2)

- සාමාන්‍ය පරිභෝජන නැමියාව යනු වැය කළ හැකි ආදායම සහ මුළු පරිභෝජන අතර අනුපාතයයි. සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC) වේ.

- වැය කළ හැකි මුළු ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් පරිභෝජනයට යොදා ගන්නේද යන්න සාමාන්‍ය පරිභෝජන නැමියාවෙන් ප්‍රකාශ වේ.

APC = $\frac{\text{පරිභෝජන වියදම}}{\text{වැයකළ හැකි ආදායම}}$ = $\frac{.C}{Yd}$ (ල. 2)

v. Y = E

E = C + I + G + (X – M)

Y = C + I + G+ ( X – M)

Y = C + 100 + 200 + (-100)

Y = 400 + 0.8 (Y – T) + 200

Y = 600 + 0.8 (Y – 150)

Y = 600 + 0.8 Y – 120

Y = 480 + 0.8 Y

Y – 0.8 Y = 480 0.2Y= 480 , $Y = \frac{480}{0.2}$ **<u>Y = 2400</u>** (ල. 4)